# සන්දේශ යවලා බෑ
# කපුටන්ට ගොඩ එන්න

## කර්තෘගේ වෙනත් කෘති

පරිධියේ මිනිහෙක් (පර්යේෂණ - 2009)

# සන්දේශ යවලා බද
# කපුටන්ට ගොඩ එන්න

සුජීව හෙට්ටිතන්ත්‍රි

සූරිය ප්‍රකාශකයෝ

සන්දේශ යවලා බෑ කපුටන්ට ගොඩ එන්න

පළමු වැනි මුද්‍රණය - 2019

© සුජීව හෙට්ටිතන්ත්‍රි

ISBN 978-955-656-571-3

**මුද්‍රණය**
එස්. ඇන්ඩ් එස්. ප්‍රින්ටර්ස්
49, ජයන්ත වීරසේකර මාවත,
කොළඹ - 10

**ප්‍රකාශනය**
අතුල ජයකොඩි,
**සූරිය ප්‍රකාශකයෝ,**
114, එස්. මහින්ද හිමි මාවත,
මරදාන, කොළඹ - 10,
ටෙලි - 2693607 *Email : sooriyabooks.lk@gmail.com*

# පිදුම

හිතේ කොහේ හෝ තිබී
දැනුත් දැනෙයි ඒ
ගඳපාන කොලවල සුවඳ.....
“අපි ආයෙ හමුවෙන්නෙ නැත්නම්
මට මොටද”
ඔයා ඇහුවා මතකයි
මේ ඉනේ තියෙන මාල පොට
තද කුණු ලේ පාටට මම දැක්කා
මගේ අතින් කැඩෙද්දි
ඒ මාලෙන් වැටුණ මදටිය ඇට
මට ඉවසන්නම අමාරු
එවෙලෙ ඔයාගෙ ඇස් දෙකෙන්
සට සට ගාලා වැටුණ
කඳුළු කැට......
මේ රට ගොඩාක් පොඩියි කිව්වට
මගේ අත හරිද්දි ඔයා
බැරිවුණා කවදාවත්ම
ආයෙ හමුවෙන්න අපට
ඒ නිසයි හිත් දෙන්නෙ
අපේ අම්මටවත් නොදී
ඔයාට දෙන්න
මේ අකුරු ටික

# ආදරය

සමාජ විද්‍යාවට හා මානව විද්‍යාවට අදාල පොත පත සහ ශාස්ත්‍රිය ලිපි ලේඛන කටයුතු මගේ අතින් ලියැවුණ ද කවිය වැනි කලා මාධ්‍යයක් සම්බන්ධයෙන් සැලකිය යුතු මැදිහත්වීමක් සිදු වී නැති තරම් ය. එහෙත් පාසල් අවධියේ සිටම කවි ලිවීමට සහ කියවීමට රුචියක් මා තුල විය. පාසල් සහ විශ්වවිද්‍යාල අවධියේදී ලිවූ කවි සමහරක් විවිධ පුවත්පත් වලට තැපැල් කර යැවූ අතර එයින් එකක් දෙකක් පල වූ බව මට මතකය. ලිවූ බොහෝ කවි ලිවූ තැන් තැන් වලම එහෙමම ඇස් පියා ගත්තේය. එහෙත් පහුගිය අවුරුදු කිහිපය තුල යලිත් කවියට පෙම්බඳින්නට පෙලඹවූයේ වේගයෙන් අප සමාජයට ආකර්ශනය වූ සමාජ මාධ්‍යයි.

මේ පොතට ඇතුලත් බොහෝ කවි මම මුහුණු පොතට ලියා පළ කළ කවිය. කාලයක් කවි ලිවුවද ඒ කවි මිනිසුන් අතරට ගෙන යාමට මාධ්‍යයක් නොමැතිව සිටි බොහෝ පිරිසකට සමාජ මාධ්‍යයේ ආගමනයත් සමඟ තම නිර්මාණ සමාජගත කිරීමට නව ද්වාරයක් විවර විය. මෙතෙක් සුළු පිරිසක් අතර හැසිරුණ කවිය ගීතය වැනි කලා ශානරයන් වැඩි පිරිසකට විවෘත විය. මගේ කවියේ දෙවන ආගමනය සමාජ මාධ්‍ය නොවන්නට සිදු නොවන්නට ඉඩ තිබිණ. කවි එකින් එක මුහුණු පොතට ලියා පළකිරීමත් සමඟ සැලකිය යුතු පාඨකයන් පිරිසක් මා වටා ගොනු වූ අතර එයින් කිහිප දෙනෙක් කවි පොතක් කරන ලෙසද මට යෝජනා කළේය. කම්මැලිකම යටපත් කරගෙන බල කිරීම නැගී සිටිය හෙයින් අද මේ කවි පොත ඔබ අතට පත් වේ.

ජීවිතය සුළඟ මෙන් පටන් ගෙන වරෙක පාන්දර පිණි වැටුණු තුරු මුදුන් උඩින්ද වරෙක පත් හැලුණු තියුණු කටු ගහන වනාන්තර මතින්ද හමා යමින් සිටී. කළුතර දිස්ත්‍රික්කයේ ඈත එපිට පිටිසර මූකලානට යාබද කුඩා කඳු ගැටයකින් ඉර එළිය දුටු ඒ සිඟිති

සුළඟ නෙක ජීවන අත්දැකීම් ලබමින් බොහෝ දුර හමා ගොස් නොසිතූ තැනක සැරිසරයි. තවත් මා යන්නට දුරක් ඇත. කොහේ යන්නෙද පාර කෙබඳුද යන්න සුළඟට පවා කිව නොහැක. හමා ආ ගමන විටෙක වේදනාත්මකය. විටෙක කටුකය. ආදරය ද ඒ ගමන අතරතුරදී හමු විය. හමුවීම මෙන්ම වෙන්වීමද හමුවිය. කඳුළු කැට මෙන්ම සිනා මල් ද හමු විය. ඒ ජීවිතේ හැටිය. මේ මගේ සියළු කවි ඒ ආ ගමනේදී හමු වූ සිනහව කඳුල තුළින් මා අහුලා ගත් අකුරුය. මේ අකුරු මගේ දෑතින් මේ මහ පොළොවට විසි කරන්ට පෙර මට ආදරය කළ දුක සතුට බෙදාගත් මිනිසුන් සිහිකළ යුතුය.

ඉතින් මේ මොහොතේ ගෙදර හාල් නැති දාට බලට්ටක් බැඳ කොස් ගෙඩියක් කඩා තම්බා පොල් එක්ක හරි කන්න දී බඩ පිර වූ ආදරණීය අම්මාව මුලින්ම සිහිපත් කළ යුතු ය. රාත්‍රි අවසාන බස් එකේ අන්තිම පඩියේ තනි අතින් එල්ලී වැඩට ගොස් එද්දී පපුවට තුරුළු කරගෙන පාන් රාත්තලක් ගෙනැවිත් අක්කාටත් මටත් කැවූ තාත්තා ආදරයෙන් වැළැඳ ගත යුතු ය. පුංචි සන්දියේ කක්කුස්සියක් නැති පැලේ පහල වන රොදෙහි තුත්තිරි ඇනි ඇනී කක්කුස්සි ගිය මාව එක අතකින් අල්ලාගෙන අනිත් අතින් මගේ කලිසම් කොටය ගෙන මට යන්නට බැද්ද මැත් කර පාර පෙන්නා ඇලට එක්ක ගොස් පස්ස සේදූ අක්කා කෙසේ අමතක කරන්නද?

ජීවිතේ දුක සැප එකට බෙදාගෙන ආදරය මේ යයි මට කියාදෙන ආදරණීය බිරිඳ සොනාලිද මට මතක් වේ. කවියක් ලියද්දි අතින් ඇද සෙල්ලමට කැඳවාගෙන යන මගේ චූටි දුව ඒනාරාද ආදරෙන් සිප ගමි. කවි ලියන්නට පටන් ගත් දා සිට දිනෙන් දින මා සොයා ආ ආදරණීය මිතුරු මිතුරියන් නොවන්නට මේ කවි එකතුව සිහිනයකින් කෙළවර වන්නට ඉඩ තිබිණ. හැමදම මම ඔවුන්ගේ සෙනෙහසට ණය ගැතිය. කවි පොතක් කරන්නෙ කවදාදැයි අසමින් බල කළ සමන් ලෙනින්, නිලක්ෂි හැලපිටිය, බුද්ධික අතුකෝරළ, නයනසේන වන්නිනායක, අමිත් ලියනගේ, සමාධි සේනානායක යන මිතුරු මිතුරියන්ද සිහිපත් කළ යුතුය. මුහුණු පොතෙහි කවි පළ කළ පසු ඒවා ගෙන පුවත්පත් වල කවි

පිටු වලට ඇතුළත් කළ ඒ ආදරණීය මිනිසුන්ට ද මම නිර්මාණ ජීවිතයේදි ණය ගැතිය. ඇතැම් ලිවූ කවි වලට සංවේදී ගායක ගායිකවන් ඒවා ඉල්ලා ගෙන ගීත බවට පරිවර්තනය කිරීමට තරම් නිහතමානී විය. ඔවුන් ද මේ මොහොතේ සිහි කරමි.

කිසිදු දන හැඳුනුම්කමකින් තොරවම මගේ මේ කවි එකතුව පොතක් කරන්නට ප්‍රකාශන වගකීම බාරගත් සූරිය ප්‍රකාශන අධිපති අතුල ජයකොඩි මහත්මාවද මේ මොහොතේ කෘතවේදීව සිහිපත් කරමි.

විචිත්‍ර නිමාවකින් මේ කවි පොකුර පොතක් කිරීමට වෙහෙසවුණු ප්‍රසාද් සමරසේකර මහත්මා සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ද මගේ ස්තුතිය හිමි වනු ඇත.

ඉතා කෙටි කාලයකින් හරවත් පෙරවදනක් ලියා දෙමින් පොතට වටිනාකමක් එක් කළ සමාජ විද්‍යාවේ හා මානව විද්‍යාවේ මගේ මුල් ගුරුවරයා වන මහාචාර්ය සසංක පෙරේරාවද ආදරයෙන් සිහිපත් කරමි. සමාජය දෙස වෙනත් කෝණයකින් බලන්නට ශාස්ත්‍රීය ශික්ෂණයක් මට හුරුකළේ ඔහුය.

මගේ කවි පොත කරන්නට මට වඩා රුදව තිබුණු එකෙක් හිටියේ නම් ඒ තවත් කවියෙක් ගීත රචකයෙක් වන අසංක රුවන් සාගර වන මගේ මිතුරාය. හරියටම දවස් දෙකකට මට වඩා වියපත් වූ අසංක අයියාය. කවි වල ඇද කුද බලමින් අකුරු හදමින් එමතු නොව පොතට පසුවදනක් ලියමින් මේ කවි පොත මුද්‍රණාලයෙන් එළියට එනතුරු සියලු බර කරට ගෙන වෙහෙසුණේ ඔහුය. ඉතින් අසංකට, එහෙම නොකියවෙන නමුත් අසංක අයියාට මං නිර්මාණ ජීවිතයේදී හෙණ ණය කාරයෙක්ය.

මේ ආදරය ඒ හැමෝටමය.

**සුජීව හෙට්ටිතන්ත්‍රි**

ඒම්ස්,
ඇමෙරිකා එක්සත් ජනපදය.
2019 දෙසැම්බර්.
*Email : sugeewar@gmail.com*

# පෙරවදන

## සුජීව හෙට්ටිතන්ත්‍රීගේ 'සන්දේශ යවලා බෑ කපුටන්ට ගොඩ එන්න' කවි එකතුව කියවිය හැකි එක් ප්‍රවේශයක් පිළිබඳ කෙටි ආවර්ජනයක්

### ප්‍රවේශයඃ සමාජයීය විද්‍යා සම්භාෂණය හා නිර්මාණ කෘති

සුජීව හෙට්ටිතන්ත්‍රීගේ 'සන්දේශ යවලා බෑ කපුටන්ට ගොඩ එන්න' යන මේ කවි එකතුවට පෙරවදනක් ලියන ලෙස කළ ආරාධනය මා යම් මට්ටමකින් තැති ගැන්මකට ලක් කළේය. ඊට හේතුව නම් භාෂාව සමග නිරතුරුව ගණුදෙනු කළද මා කවියෙක්වත් නිර්මාණ කරුවෙක්වත් නොවීමත්, මේ නිර්මාණනීය අඩවිය පිළිබඳ සප්‍රමාණික දැනුමක් ඇති අයෙකු නොවන බවත් මා මැනැවින් දැන සිටි නිසාය. වරින් වර කවියක් දෙකක් කාල වේලා ඇති පරිදි ලියා තිබීම හා ගුණදාස අමරසේකර සහ සිරි ගුණසිංහ වැනි කවීන්ගේ කවි පාසැල් සමයේදී හා සරසවි යුගයේදී පුළුල් වශයෙන් කියවා තිබීමද බුද්ධදාස ගලප්පත්ති, කපිල ගමගේ හා කුමාරි කුමාරගමගේ වැනි මා පුද්ගලිකව දන්නා කවීන්ගේ කෘති වඩාත් මෑතකාලීනව කියවා රස විඳ තිබීමද මීට බෙහෙවින් බරිහාහිර කාරණාය. නමුත් මතවාදීමය හා විධික්‍රමික වශයෙන් මේ කවි එකතුව මගේ විධිමත් පුහුණුවේ හා බුද්ධිමය උනන්දුවේ සීමා තුළ කියවිය හැකි ආකාරයක් මේ පිළිබඳව සිතීමේදී මට මෙනෙහි විය. එනම්, කලා කෘති සමාජවිද්‍යා විශ්ලේෂණයේදී හා රචනාකරණයේදී යොදා ගත හැක්කේ කෙසේද හා එසේ යොදා ගත හැකිද යන මගේ දීර්ඝකාලීන විචිකිච්චාවේ තවත් එක් ප්‍රකාශයක් ලෙසිනි. මෙහිදී කලා කෘති වශයෙන් මා අදහස් කරන්නේ චිත්‍ර, මූර්ති, ස්ථාපන, නාට්‍ය, චිත්‍රපට, නව කතා, කෙටි කතා සහ කවි වැනි අනේකවිධ කලාකෘතීන්ය. මෙහිදී මතු වන ප්‍රධානතම හා සරලම ගැටළුව නම් සමාජවිද්‍යාව වැනි වාස්තවික

තොරතුරු, සංඛ්‍යානමය දත්ත, තර්කය, න්‍යායකරණය හා අර්ථකතනය මත පදනම් වූ විෂයකට එසේ නොවූ හා අතිශයින් පුද්ගල නිශ්‍රිත වූ ඉහත දක්වූ ආකාරයේ කලා නිර්මාණ පර්යේෂණ මූලාශ්‍ර හෝ පර්යේෂණ අභිප්‍රායක් ලෙස සැලකිය හැකිද යන්නය. මේ සාම්ප්‍රදායික ප්‍රශ්නයට පරිපූර්ණ හා අවසාන පිළිතුරක් තවමත් ලැබී නැත. එනමුත්, තත්කාලීන සමාජවිද්‍යාවේ යම් බුද්ධිමය දියුනුවක් දැකිය හැකි අවකාශවල අවම වශයෙන් මේ ප්‍රශ්නය මහා ගැටළුවක් වශයෙන් තව දුරටත් මතුවන්නේ නැත. එයට එක් හේතුවක් වන්නේ සමාජයීය විද්‍යා භාවිතය තුළ පුද්ගල නිශ්‍රිතත්වය හා විෂය මූලිකත්වය යනු කුමක්ද යන්න පිළිබඳව 1970 ගණන්වලදී මිලින වී ගිය කතිකාවේ පැහැදිලි නිගමන දැකගත නොහැකි වීමය. මෙනිසා හුදෙක් පුද්ගල නිශ්‍රිතත්වය යන ලේබලය මත පිහිටමින් පමණක් යම් මූලාශ්‍රයක් සරලව ඉවත දැමිය හැකි තත්ත්වය සාපේක්ෂ වශයෙන් දියුණු බුද්ධිමය අඩවිවලින් යම් දුරකට ඉවත්වීය. අන් කාරණය නම්, සමාජයීය විද්‍යාවන් සිසාරා පැතිර ගිය පශ්චාත් නූතනවාදයේ බලපෑම නිසා බැලූ බැල්මට විෂය මූලික යැයි කලින් කල්පනා නොකළ බොහෝ මූලාශ්‍ර හා ප්‍රවේශ සමාජයීය විද්‍යා සම්භාෂණයට නොයෙකුත් ආකාරවලින් අවතීර්ණ වීමය. සංස්කෘතික අධ්‍යයන (Cultural Studies) මින් එක් ප්‍රවේශයකි.

මේ පිළිබඳව පසුගිය දශක දෙකක පමණ කාලය මුලුල්ලේ කළ කියවීම් හා සිතා බැලීම් හරහා මා දැනට ගොඩනගාගෙන ඇති පුද්ගලික විශ්වාසය නම් බෙහෙවින් ප්‍රවේශම් සහගතව කටයුතු කරන්නේ නම්, යම් පැහැදිලි සීමා තුළ නිර්මාණ කෘති වුවද සමාජවිද්‍යා කතිකාව තුළට මෙන්ම වඩාත් පුළුල්ව අන් සමාජයීය විද්‍යා කතිකා තුළටද පර්යේෂණ තොරතුරු, මූලාශ්‍ර හා ලේඛනකරණ මග සළකුණු වශයෙන් යොදාගත හැකි බවයි. සුජීව හෙට්ටිතන්ත්‍රීගේ කාව්‍යකරණය තුළට මා අවතීර්ණ වන්නේ මේ ප්‍රවේශය හරහාය. වඩාත් පැහැදිලිව කියනවා නම්, ශ්‍රී ලංකාවේ සමාජය, සංස්කෘතික ගතික, දේශපාලන ප්‍රවණතා ආදිය පිළිබඳ සමාජවිද්‍යාත්මක කියවීමකට යන්නට මට ඔහුගේ කවි යම් අත්වැලක් සපයයි යන්න මාගේ විශ්වාසයයි.

කෙසේ වුවද 'සන්දේශ යවලා බෑ කපුටන්ට ගොඩ එන්න' කවි එකතුව ඉහත දැක්වූ ආකාරයට කියවිය හැකිද යන්න සලකා බැලීමට පෙර, මාගේ ප්‍රවේශය යම් දුරකට විස්තර කිරීම සුදුසු යැයි මට සිතේ. ආසියානු කලාපයේ දෘශ්‍ය කලාව හා සමාජ හා දේශපාලන ගතිකයන් අතර ඇති සහසම්බන්ධතාවන් පිළිබඳ අදහස් ඉදිරිපත් කළ ආචාර්ය කැරොලින් ටර්නර් පවසා ඇත්තේ මෙවන් අදහසකිඃ ''තමන්ගේ කලා කෘති හරහා කලාකරුවන්ට තම තමන්ගේ සමාජවල මෙන්ම සමස්ථ මානව සංහතියේම අපේක්ෂාවන් හා අගයන් ඉදිරිපත් කළ හැක. අතැමුන් මෙකී තත්ත්වයන්ට ශ්වනවාදීව (cynicism) හා ඇතැම් විට නෂ්ටාපේක්ෂාවදීව (despair) මුහුණ දෙන අතර, අන් කලාකරුවන් මෙකී තත්ත්යවන්ට මුහුණ දීම සඳහා ප්‍රතිරෝධය (resistance) පිළිබඳ කලාවක් නිර්මාණය කරති.

මේ අනුව, පසුගිය දශක කිහිපය මුළුල්ලේ ආසියානු-පැසිෆික් කලාපයේ කලාකරුවන් යටත්විජිතවාදය හා නව-යටත්විජිතවාදය, ස්වභාවධර්මයේ ගෝලීය ව්‍යමණය, සංස්කෘතික විනාශය, දරිද්‍රතාව නිසා රෝගී බවට පත්වීම, ලිංගික සූරාකෑම, සමාජයීය හා දේශපාලනික අසාධාරණය, යුද්ධය, ප්‍රචණ්ඩත්වය හා ජාතිවාදය පිළිබඳව තම කලා භාවිතය ඔස්සේ විරෝධය ප්‍රකාශ කර ඇත.''[1] ටර්න්ර් මේ විස්තර කර ඇත්තේ හුදු ආශ්වාදය සඳහා පමණක් නිර්මාණය කළ කලා කෘති පිළිබඳව නොවේ. ඇය මේ සාකච්ඡා කරන්නේ සමාජ දේශපාලන තත්ත්ව ඍජුවම ආමන්ත්‍රණය කරන දේශපාලන කලා (polititical art) ප්‍රවණතා පිළිබඳවය. සමාජයීය විද්‍යාඥයින්ද මෙකී තේමාවන්ම බොහෝ විට තම අධ්‍යයන සඳහා පාදක කර ගත්තද ඔවුන්ගේ මූලාශ්‍ර ලෙස කලා නිර්මාණ භාවිත වන්නේ ඉතාමත් අල්ප වශයෙනි. 2012 දී පලවූ ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රචණ්ඩත්වය, ස්මෘතිය හා තත්කාලීන කලාව පිළිබඳ රචනයේදී මාගේ ප්‍රධාන පර්යේෂණ ඉලක්කය මෙන්ම මූලික පර්යේෂණ මූලාශ්‍ර වූයේද

1. Caroline Turner, 'Art and Social Change,' pp. 4. In, Caroline Turner ed., Art and Social Change: Contemporary Art in Asia and the Pacific. Canberra: Pandanus Books, 2005.

1990 න් පසු ශ්‍රී ලංකාවේ නිර්මාණය කළ දේශපාලනික වශයෙන් සංවේදී වූ කලා කෘතීන්ය.[2]

2017 වසරේදී ආචාර්ය මල්ලිකා ශාක්‍යා විසින් ලියන ලද නිබන්ධයක මූලික අභිප්‍රාය වූයේ මෑතකාලීන නේපාලයේ ජනප්‍රිය නවකතා විචාරාත්මකව කියවීම මගින් ඒවා තුළින් දේශ සීමා පිළිබඳව ගොඩනැගී ඇති ජාතික අර්ථකතන තේරුම් ගැනීමය. ඇයගේ උත්හාහය වූයේ සාහිත්‍යයික පරිකල්පනයන් ආශ්‍රය කිරීම තුළින් සමාජයීය විද්‍යා ප්‍රවර්ග වඩාත් පුළුල් කිරීමත් ඒවායේ විශ්ලේෂණීය හැකියාවන් තීව්‍ර කිරීමත්ය.[3] මෙලෙසින්ම, 2019 අප්‍රේල් මාසයේදී ඇය විසින් නව දිල්ලියේ දකුණු ආසියානු විශ්වවිද්‍යාලයේදී සංවිධානය කළ 'දකුණු ආසියාව පිළිබඳ කාව්‍යමය පරිකල්පනා: දේශ සීමා හා ජාතීන්'[4] යන සම්මන්ත්‍රණයේ මුඛ්‍යාර්ථය වූයේ දේශ සීමා හා ජාතිය යන තේමා පිළිබඳ බුද්ධිමය උනන්දුවක් ඇති කවීන්, නිර්මාණ කතා රචකයින් හා සාහිත්‍යවේදීන්ට සමාජ විද්‍යාඥයින්, මානව විද්‍යාඥයින් හා සමාජ ඉතිහාසඥයින් සමග කතිකා කිරීමට හැකි බුද්ධිමය අවකාශයක් විවර කරදීමය.[5] එමගින් ආචාර්ය ශාක්‍යගේ උත්සාහය වූයේ ඇයගේ 2017 නිබන්ධනයේ දක්වූ මූලික අදහස් තවදුරටත් ව්‍යාප්ත කරමින්, විශේෂයෙන් කවිය හා ප්‍රබන්ධ සාහිත්‍යය යන නිර්මාණ ප්‍රවර්ගයන් ජාතිය (nation) හා කලාපය (region) යන අදහස් පිළිබඳව ඇති ජනප්‍රිය තේරුම්ගැනීම් විශ්ලේෂණය කිරීමට හැකියාව ඇති ඥාන මීමංසාවක් සේ සැලකිය හැකිද යන පැනයට පිලිතුරු සෙවීමය.

මීට බොහෝ කළකට පෙර, 2006දී වෛද්‍ය ගුණදාස අමරසේකරගේ ගමනක මුල, ගමනක මැද, ගම් දොරින් එළියට,

2. අමතර විස්තර සඳහා කියවන්න: Sasanka Perera, Artists Remember; Artists Narrate: Memory and Representation in Sri Lankan Visual Arts. Colombo; Colombo Institute and Theertha International Artists' Collective, 2012.

3. Malliaka Shakya, 'Reading Parijat and B P Koirala: Belonging and Borders in 20th Century Nepali Novels,' pp. 53-60. In, Economic & Political Weekly, April Volume LII, No. 15, April 2017.

4. සම්මන්ත්‍රණ තේමාව විස්තර කළ මුල් ඉංග්‍රීසි පද වැල මෙසේය: The Poetic Imagining(s) of Southasia: Borders and Nations. මේ සම්මන්ත්‍රණයේදී nation (ජාතිය) යන පදය තුළ ජාතිය හා ජාතික රාජ්‍යය (nation state) යන අර්ථ දෙකම ගැප් වී තිබුනි.

5. http://sau.int/downloads/Poetics2019conferenceCFP.pdf

ඉනි මගේ ඉහළට, වංකගිරියක, යලි මහ වෙත හා දුරු රටක දූකට කිරියක යන කෙටි නවකතා මාලාව පිළිබඳ මා ලියූ විචාරයකින් මා යෝජනා කළේ වෛද්‍ය අමරසේකරගේ උත්සාහය වූයේ සිංහල මධ්‍යම පන්තිය ආශ්‍රයෙන් එකී ජන ප්‍රජාව අත්දුටු සමාජ හා දේශපාලන විපර්යාස හා ඔවුන් නගරයට සංක්‍රමණය වීමෙන් පසුව ලත් අත්දැකීම් පිළිබඳව බෙහෙවින් ඍජු හා නියෝජනවාදී (representational) කතිකාවක් ලිවීම බවයි.[6] එමගින් ඔහු සිංහල සමාජය පිළිබඳ පුළුල් සමාජ ඉතිහාසයක් රචනා කරන ලදී. මාගේ තර්කය වූයේ මතවාදී හා සාහිත්‍යමය ශක්‍යතා සම්බන්ධයෙන් කුමන ගැටළු තිබුනද මේ පොත් පෙළ ශ්‍රී ලංකාවේ දකුණු පළාතෙන් ප්‍රභවය ලැබූ සිංහල බෞද්ධ ප්‍රජාව පිළිබඳව ලියැවී ඇති වඩාත් දියුණු ප්‍රබන්ධිත සමාජ ඉතිහාසය බවත්, එය ශ්‍රී ලාංකේය වෘත්තීය සමාජ මානව විද්‍යාඥයින් හා ඉතිහාසඥයින් විසින් මේ පිළිබඳවම ලියා ඇති අසම්පූර්ණ හා නීරස මානව වංශ ලේඛන (ethnographies) හා ඓතිහාසික රචනාවන්ට (historiographies) වඩා බෙහෙවින් සාර්ථක බවත්ය.[7] මෙලෙසින්ම, 2016 දී ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ කාලයේ උතුරුකරය දෙසට ව්‍යාප්ත වූ සීමා රහිත සංචාරක ක්‍රියාවලීන් ගැන මා කළ විශ්ලේෂණයේදී යුද සමයේ A 9 මහාමාර්ගයේ දැක ගත හැකි වූ අන්ත ප්‍රචණ්ඩත්වය සන්දර්භගතකිරීමට දීර්ඝ විස්තරයක් ඉදිරිපත් කරනු වෙනුවට මා යොදාගත් මෙවලම වූයේ රුද්‍රමූර්ති චේරන්ගේ 'කඳෙන් වෙන් කළ කකුලක් පිළිබඳ කතාව' යන දමිල කවියේ ඉංග්‍රීසි පරිවර්තනයයි.[8]

මේ උදාහරණ සියල්ලෙන්ම පෙන්නුම් කරනුයේ කවියට හා අන් නිර්මාණනීය කතිකාවලට විධිමත් සමාජයීය විද්‍යාවන් සමග බුද්ධිමය ගනුදෙනුවක් ඇතිකරගැනීමට ඇති හැකියාවය. සුජීව හෙට්ටිතන්ත්‍රිගේ කවි එකතුව මා තේරුම් ගන්නට උත්සාහ

6. Sasanka Perera, 'Fiction, Creativity and Politics: Reading Gunadasa Amarasekera's Gamanaka Meda', 2006. In, The Island. Available at: http://www.island.lk/2006/05/25/features5.html

7. Sasanka Perera, 'Fiction, Creativity and Politics: Reading Gunadasa Amarasekera's Gamanaka Meda', 2006. In, The Island. Available at: http://www.island.lk/2006/05/25/features5.html

8. Sasanka Perera, Warzone Tourism in Sri Lanka: Tales from Darker Places in Paradise, pp. 18-19. New Delhi: Sage, 2016.

ගන්නේද මේ ආකාරයෙනි. එසේ කිරීමේදී මාගේ උනන්දුව මූලික වශයෙන් යොමු වන්නේ මේ කවිවල සමාජ-දේශපාලනික පාඨනීය හැකියාව වෙත මිස ඒවායේ භාෂාමය හෝ අන් තාක්ෂණික ලක්ෂණ වෙත නොවේ. මේ කවි එකතුව වසර හතරක හෝ පහක කාලයක් මුළුල්ලේ මුහුණු පොතේ වරින් වර ලියා පළ කල කවි තත්කාලීනව එක්තැන් කරන්නට ගත් උත්සාහයකි. ඒවා මා තේරුම් ගන්නේ සමාජවිද්‍යාව පිළිබඳ විධිමත් පුහුණුවක් ඇති කවියෙකුගේ බැල්මට හසුවූ ශ්‍රී ලංකාවේ අනේක වූ සමාජ-දේශපාලනික හා සංස්කෘතික බේදවාචකයන්ගේ පැතිකඩවල එකතුවක් වශයෙනි. එමෙන්ම, මේ කවි දීර්ඝකාලීනව උතුරු අමෙරිකාවේ ජීවත්වන කවියා වරින් වර සිය මව් රටට පැමිණෙන විටත් තමන් දැනට ජීවත්වන දේශයේ සිට බලන කළ වඩාත් පැහැදිලිව විද්‍යාමාන වන ලාංකේය පරස්පරවිරෝධතාවන්ගේ දැඩි චිත්තවේදීය කියාපෑමක් ද වේ. කවියාම පවසන ආකාරයට, මේ කවිවල පදනම වූයේ ''වෙන රටක ඉඳලා ලංකාව දිහා බලන කොට ඒකෙ තියෙන අවුල මාර විදියට''[9] පෙනීමය. මෙලෙසින් ඔහු වඩාත් දුටුවේ ලංකාවේ පසුගිය කාලයේ පුළුල් ලෙස ප්‍රචලිත වූ සංවර්ධනය පිළිබඳ මායාව නොවේ. ඒ වෙනුවට ඔහු දුටුවේ, ''දුක් විඳින මිනිසුන්ගේ ජීවිතවල බේදවාචකයයි.''[10] තවද ඔහු පවසන්නේ ඔහුගේ ''කවි ලියනව කියලා හිතලා ලිව්වේ නැති'' බවත්, ඒවා ''ඉබේම ලියවුන බවත්ය.''[11] මේ අනුව බලන කළ මේවා පැහැදිලි ලෙසම තමන් දුටු දේ හා තමන්ට හැඟුනු දේ පිලිබඳව ලියැවුනු ප්‍රතිචාරාත්මක හා චිත්තවේගීයව වඩාත් තීව්‍ර වූ කවි එකතුවක් ලෙස තේරුම් ගත හැකිය. කවියාගේ බස පාඨකයා සන්තෘප්තිමත් කරන ලයාන්විත භාෂාවක් නොවේ. එය බොහෝ විට මීට හාත්පසින්ම වෙනස්, ඇතැම් විට කයෝර හා රළු බසකි. එමගින් කරනුයේ පාඨකයින්ව ඔවුන්ගේ නිද්‍රාශීලී, විස්මෘතික, කෘත්‍රිම හා අභ්‍යන්තරිකව සන්තෘප්තිමත් ලොවින් වෙන් කර බලයෙන්ම කවියා දකින යථා ලොවට ඇද දැමීමය. සුජීව හෙට්ටිතන්ත්‍රීගේ කවි මූලික වශයෙන් වේදනාවෙන්, කේන්තියෙන්, මහ හඬින්

9. මෙසෙන්ජර් පණිවිඩයකින් ලත් තොරතුරු, නොවැම්බර් 14, 2019.
10. මෙසෙන්ජර් පණිවිඩයකින් ලත් තොරතුරු, නොවැම්බර් 14, 2019.
11. මෙසෙන්ජර් පණිවිඩයකින් ලත් තොරතුරු, නොවැම්බර් 14, 2019.

හා ඍජුවම තම අදහස් නිර්භීතව ඉදිරිපත් කරන වාහකයන්ය. එනමුත් ඔහු එය කරනුයේ බොහෝ විට කරුණාව, හාස්‍යය, සමාජ ඉතිහාසය හා උපහාසය ද පෙරදැරි කරගෙනය. ඔහුගේ කවිවලින් මතුවන ප්‍රධාන තේමා හතරක් පිළිබඳව පමණක් මාගේ අවධානය මේ රචනයේ ඉදිරි පිටු කිහිපය ඔස්සේ යොමුවේ. මාගේ විශ්වාසය මේ තේමා සමස්ථයක් වශයෙන් මේ කවි එකතුවේ කාව්‍යමය හා සමාජ-දේශපාලනික පෞරුෂය ගොඩනගන බවයි.

## සංවර්ධනය හා එහි ප්‍රතිවිරෝධතා

කතිකාවක් ලෙස සංවර්ධනය රටක සමෘද්ධිය, දියුණුව හා ඉදිරිගාමීත්වය කියාපාන බවට විශ්වාස කරන සංකේතය. නමුත් අහස සිඹින්නට මෙන් උසට ඉදිවෙන මහා ප්‍රාසාද, රට සිසාරා දිවෙන මහාමාර්ග හා රට පුරා සංවිධානය කරන උත්සව යනාදී භෞතික සංකේත සැබෑ සංවර්ධනයක ලක්ෂණ වන්නේ එවැනි රටවල මහජන ශුභසිද්ධියට අවැසි මූලික සේවා හා මේ භෞතික සංකේතවල ප්‍රයෝජනය ලබා ගැනීමේ හැකියාව සාපේක්ෂ වශයෙන් රටේ බොහෝ දෙනාට තිබේ නම් පමණි. එසේ නොවන්නේ නම්, මේවා හුදු මායාකාරී සංවර්ධනයක හෙවනැලි පමණක් බවට පත්වේ. 2015 ට පෙර ලංකාවේ සංවර්ධනය පිළිබඳ රාජ්‍ය කතිකාවේ ප්‍රධාන කොටසක් වූයේ කොළඹ නගරය අලංකරණය කිරීමේ ව්‍යාපෘතිය වීය. එයට රට වැසියන් බොහෝ දෙනාගේ -- විශේෂයෙන් නාගරිකයන් ගේ -- කැමැත්තක් ද වීය. එනමුත් මේ සංවර්ධනය පිළිබඳ ජනප්‍රිය හා රාජ්‍ය කතිකාවේ හඬින් වසන් වූ කතිකාවක් ද වීය. ඒ, මේ ඇතැම් සංවර්ධන කටයුතු නිසා ඉඩම් අහිමි වූ හා ඒවාට නිසි මූල්‍ය වන්දි නොලැබූ පුද්ගලයින්ගේ දුක්මුසු හඬයි. දෙමටගොඩ හා කොම්පඤ්ඤ වීදිය වැනි ප්‍රදේශවල මෙවැනි ව්‍යාපෘති නිසා විස්ථාපනය වූ ජනතාවක් ද ලංකාවේ සිටිති. සැලසුම් කර තිබූ සමස්ථ නගර සංවර්ධන හා අලංකරණ ව්‍යාපෘති සියල්ලම සිදුකලේ නම්, පවුල් 70, 000 සිට පවුල් 135, 000 පමණ ප්‍රමාණයක් අවතැන් විය හැකිව තිබිණි.[12]

---

12. Centre for Policy Alternatives (2014): Forced Evictions in Colombo: The Ugly Face of Beautification, Colombo: Centre for Policy Alternatives.

මෑත කාලීන ශ්‍රී ලාංකික ඉතිහාසයේ මෙවන් විශාල පවුල් පිරිසක් නාගරික අවකාශය තුළ අවතැන් වී නැත. මෙවන් අවතැන් වීම් හා ඊට ගොදුරුවන පුද්ගලයින්ගේ ශුභසාධනය පිළිබඳව සලකා නොබලන සංවර්ධනයක් සැබැවින්ම අව-සංවර්ධනයකි. ඒවායින් ප්‍රයෝජන ලැබෙන්නේ සමාජයේ වරප්‍රසාදලාභී කොටස්වලට පමණි. එනමුත් මේ ඊනියා සංවර්ධන ක්‍රියාවලියේ හුදු දෘශ්‍යමය පරිභෝජනයෙන් මතවාදීමය හා චිත්තවේගීය වශයෙන් සන්තෘප්තියට පත්වන බොහෝ සාමාන්‍ය ජනයා ලංකාවේ මෙන්ම කලාපයේ අන් රටවලද සිටිති. සුජීව හෙට්ටිතන්ත්‍රීගේ කවිවල තේමා අතරට ඇතුලත් වී ඇති ප්‍රබල අදහසක් වන්නේ මෙවැනි කණපිට පෙරළුන සංවර්ධන ක්‍රියාවලීන් හා එහි ආදීනවය. ‘නෙළුම් උත්කර්ෂයට නගන ගෙම්බන්ට ගෙම්බෙක් අනතුරු අඟවයි’ යන කවියෙන් හාස්‍යයද මුසුකරමින් ඔහු මතුකරන්නට උත්සාහ කරනුයේ මේ තත්ත්වයයි:

කිසි දනුම් දීමකින් තොරව
කොන්ක්‍රීට් වලින් පිරෙව්වේ
ගෙම්බන්ගෙ මඩ වල
ඊටපස්සෙයි ඉස්ම ටික උරාගෙන
පැල්පත් මරාගෙන
පීදුනේ මේ නෙළුම් මල

පුප්පා සුවඳ බීගත්
හුළඟ ගෙනැත් අතැර අවසන්
ගෙම්බන්ගෙ කුණු ඇළට
මල පුප්පන්න ගිය බිල
උඩින් මඩේ මලක් ගැහුවට
ඇයි ගෙම්බන්ට තේරුම් ගන්න බැරි
විලක් නොවනා වග උන්ගෙ වල

හෙට්ටිතන්ත්‍රීගේ කාව්‍යමය විවේචනය හුදෙක් සංවර්ධනය යව ක්‍රියාවලිය පිළිබඳවම නොවේ. ඔහුගේ කාව්‍යමය හාස්‍යය හා කෝපය යොමුවන්නේ මහජනයාට සෙතක් ගෙන නොඑන, රට ජාත්‍යන්තර ණය උගුල්වලට හිරකරන හා නිසි ලෙස දීර්ඝ කාලීන

සැලසුම්කරණයකින් තොර පම්පෝරිසහගත සංවර්ධන ව්‍යාපෘති වෙතටය. මේ කවිය හා ඒ තේමාව යටතේම ලියැවුනු අන් කවි ද කියවන විට මගේ මතකයට එන්නේ කොළඹ නෙළුම් කුළුණ, පෝට් සිටි ව්‍යාපෘතිය, හම්බන්තොට වරාය හා මත්තල ගුවන් තොටුපොල වැනි විනාශකාරී ව්‍යාපෘතීන්ය.

## නිම නොවන දරිද්‍රතාව

දකුණු ආසියානු කලාපයේ අන් බොහෝ රටවල් හා සසඳන විට ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධන දර්ශක බෙහෙවින් දියුණු තත්ත්‍යවක පවතී. එනමුත් අප රටේ දරිද්‍රතාව හා සම්පත් මහජනයා අතර බෙදීයාමේදී දැකිය හැකි දැඩි අසමානතාව අපට සුපැහැදිලිවම පෙනෙන යතාර්ථයකි. ආසියානු සංවර්ධන බැංකුවට අනුව, 2016 වන විටදී ශ්‍රී ලංකාවේ සමස්ථ ජනගහණයෙන් 4.1% ක් ජාතික දරිද්‍රතා රේඛාවටත් වඩා අඩු ආදායම් මට්ටමක ජීවත් වූහ.[13] එනමුත් මේ රේඛාවට ඉහල මට්ටමක ජීවත් වීමම දරිද්‍රතාවෙන් මිදීම පිළිබඳ පැහැදිලි ඉඟියක් සපයන්නේ ද නැත. එම වසරේම, ශ්‍රී ලංකාවේ රැකියාලාභී සමස්ථ ජනගහනයෙන් ඇමරිකානු ඩොලර් 1.90 ක දෛනික භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ තත්ත්වයේ සිටියේ 0.8% ක ප්‍රමාණයක් පමණි.[14] 2017 වන විටදී ශ්‍රී ලංකාවේ උපත ලද සෑම දරුවන් 1000න්ම පස්දෙනෙකු තම පස්වැනි උපන්දිනයට පෙර මිය ගියහ.[15] මේ දත්ත මගින් ඉදිරිපත්කරන්නේ ශ්‍රී ලංකාව පිළිබඳ සාපේක්ෂ වශයෙන් අසම්පූර්ණ ප්‍රතිරූපයක් වුවද අප ඉදිරියේ දෛනිකවම ප්‍රකට වන දරිද්‍රතාව පිළිබඳ යථාව හා සම්බන්ධ පැහැදිලි සංඛ්‍යානමය හෝඩුවාවන් මේ දත්තවලින් සපයයි. හෙට්ටිතන්ත්‍රිගේ සෑම කවියකම පාහේ පදනම වන්නේ මේ දරිද්‍රතාව පිළිබඳ යථාවයි. ඔහු එය දකින්නේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ දේශපාලන ප්‍රවාහය විසින් අමතක කර දමා ඇති, එනමුත් නිරතුරුවම සමාජ-දේශපාලන කතිකාවේ මතුපිටටම ගෙනආ යුතු වාද විෂයක් වශයෙනි. **'කඩා ඉවත් කිරීමට නියමිතව තිබූ පැල්පත් පේළියේ කොලුවෙකු පාරේ කුණු අතු ගාන අම්මෙක්**

13. https://www.adb.org/countries/sri-lanka/poverty
14. https://www.adb.org/countries/sri-lanka/poverty
15. https://www.adb.org/countries/sri-lanka/poverty

ළඟට දිව ගොස් හදිසියේ කියූ කවියක්' යන බෙහෙවින් දීර්ඝ සිරසකින් යුත් කවි පන්තියෙන් ඔහු වේදනාව, කෝපය හා ගැඹුරු කරුණා ගුණයක් ද පෙරදැරි කරගෙන පවසන්නට උත්සාහ ගන්නේ මේ දරිද්‍රතාවයෙන් වෙලීගත් ජනයාට නිරතුරුවම ජීවත් වන්නට සිදුවන ආන්තික ජීවිතය මෙන්ම සංවර්ධනය වැනි ක්‍රියාාරකම් ඔවුන්ගේ ජීවිතවලට කරන නිශේධනීය බලපෑම් පිළිබඳවය:

අම්මේ ටකරමක කණට ගහලා
ඩෝසරේ මේ දූන් ගෙට ගොඩ වුණා
බිත්තියේ හිටපු සමන් දෙයියන්ව
එක කටට ඌට මදි වුණා

යටලීය හපල ඩෝසරේ කිරි වේයෝ බොද්දී
මඩ වලේ අක්කා ගෝණියක ගුලි වුණා
අම්මේ මං මේ ඌට කියලා ආවේ
"යකෝ ඊයෙ රෑ අපේ අක්කා ලොකු වුණා"

නගරාශ්‍රිත දරිද්‍රතාව හා එනිසාම දුගී ජනයා ගෙවන ආන්තික හා වේදනාකාරී ජීවිත පිළිබඳ ඉහත කවියෙන් කියා පෑ අයුරින්ම 'ගහක් මුදුනට සඳක් නැගලා' යන කවියෙන් හෙට්ටිතන්ත්‍රී අපව ගෙන යන්නේ නගරයෙන් බොහෝ දුර වනාශ්‍රිතව කෘෂි කර්මාන්තයෙන් ජීවත්වන ග්‍රාමීය ජනයාගේ දුප්පත්කම, වේදනාව හා ඔවුන්ගේ ජීවන ශෛලිය නිසාම ඇතැම් විට මුහුණපාන්නට සිදුවන හදිහි මරණ වැනි තත්ත්වයන් වෙතටය:

අඳුර ඇඳගෙන ඇත්තු ඇවිදින
හරිම මූසල මංඩියේ
වැවේ දෙවියනි මේ තියෙන්නේ
අපි උදේ කෑ වැල් අලේ

වී දෙපෑලක් උගස් කරලා
ගෙනැත් ඇති පංචායුදේ
අලි හිතක් ඇයි අඩිය තිබ්බේ
පොඩි පුතා සැතපුණු කුසේ

**පටු දේශපාලනයේ සමාජයීය බර**

සුජීව හෙට්ටිතන්ත්‍රිගේ කවි වලින් මතුවන තවත් ප්‍රධාන තේමාවක් වන්නේ ශ්‍රී ලංකාවේ දනට ක්‍රියාත්මක වන විනාශකාරී හා පටු දේශපාලනය පිළිබඳ විචාරශීලී විවේචනයක්ය. නිදහසින් පසු හා වඩාත් පැහැදිලිව 1970 දශකයෙන් පසුව ශ්‍රී ලංකාවේ ස්ථාපිත වී ඇති ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් කියාත්මක වන දේශපාලනය විසින් මෙරට ප්‍රජාතාන්ත්‍රිය දේශපාලනික සංස්ථා හා භාවිත අකර්මන්‍ය කර ඇත. මේ තත්ත්වය යටතේ සමස්ථ දේශපාලනයම දූෂණය, ප්‍රචණ්ඩත්වය හා අදූරදර්ශීත්වය මත පදනම්වී ඇති අතර එය මූලික වශයෙන් අචාරධර්ම විරෝධී හා අශිශ්ඨ ක්‍රියාවලියක් බවට පත්ව ඇත. වඩාත් අවාසනාවන්ත කාරණය නම්, මේ දීර්ඝකාලීන හා විනාශකාරී කර්තව්‍යයේදී අපගේ අදූරදර්ශී නායකයන්ට මහජනතාවගේ සහායද නොමඳව ලැබී තිබීමය. එනම්, නොයෙකුත් ආකාරයේ මැතිවරණ ලංකාවේ පැවැත්වුව ද ඒවායින් ජනතාව නිරතුරුවම සිය කැමැත්තෙන්ම තෝරා ගන්නේ නුසුදුස්සන් වන අතර, පවතින තත්ත්වය වෙනස් කරගැනීමට අවශ්‍ය බලපෑම පුළුල් වශයෙන් ඔවුන්ගෙන් පාලක පන්තියට ලැබෙන්නේ නැත. මෙකී දේශපාලනයට වර්ගවාදය මෙන්ම ආගමික අන්තවාදයන්ද මේ වන විට ඇතුළු වී තිබේ. හෙට්ටිතන්ත්‍රිගේ කාව්‍යකරණය මේ සමස්ථ සන්දර්භයම මතුකරලන අතර, ඒ පිළිබඳ විචාරයක් ද අප වෙත ඉදිරිපත් කරයි. ඒ අන් තේමාවන් හා සම්බන්ධයෙන් මෙන්ම කෝපය, වේදනාව, කරුණාව, හාස්‍යය හා විචාරශීලීත්වය පෙරදැරිකරගත් භාෂාවක් හා වාග්මාලාවක් තුළිනි. මොහොතකට 'මේ ගලන්නේ ඒ ගඟමයි දෙකම එකම ජාතියෙ ඉවුරු' යන කවි පන්තියේ පහත සඳහන් කවිය ගෙන බලමු:

**මේ ගලන්නෙත් ඒ ගඟමයි කාටත් හුරු**
**විසිකරයි දියට මල් උපද්දා දැලේ තුරු**
**කව්ඩෙකු ගිලිද්දී මරු ගීයක් ගයයි මෙරු**
**අපට පැයුවත් එකයි නැතත් එකයි හිරු**

වැහි වලාවක් කියා කියාගෙන ගිය
පහුගිය හුළන් කිව්වේම කපටි බොරු
දැලේ බෙදී රැම කැගැහුවට රැහැයියෝ
මේ දෙකම එකම ජාතියෙ ඉවුරු

අවුරුදු හැට හැත්තැවක් පරණ පාලම
තවත් උස්සගෙන ඉන්න ඕනමද මේ කරු
ගෝඩා හැලියක ගිලුණු ගෙම්බෙක් අහන
මාර දාර්ශනික ප්‍රශ්නයක් ඒක මරු

මට නම් පෙනෙනුයේ මේ පශ්චාත්-නිදහස් යුගයේ අපට උරුම වූ දේශපාලනයේ මූලික ලක්‍ෂණ සන්දර්භගතකිරීමක් බවයි. එනම්, මැතිවරණයෙන් මැතිවරණයට පක්‍ෂ වෙනස් වුවද දේශපාලනය හෝ එහි ආදීනව වෙනස් නොවෙන අවිචාරවත් දේශපාලනය පිළිබඳ කාව්‍යමය සිතා බැලීමක් බවයි. නිදහසින් පසු මේ පටු දේශපාලනය කරගසාගෙන සිටින මහජනතාව පාලමේ කරු බවට කවියා පත්කර ඇති අතර, ඔවුන් මහත් ආයාසයකින් ඔසවාගෙන සිටින පරණ පාලම මුලිනුපුටා දැමිය යුතු, එනමුත් මහජනයාම එසේ නොකරන විනාශකාරී දේශපාලනයයි. 'පොදු වැසිකිලිය' යන කවි පන්තිය මේ දේශපාලනය වඩාත් පැහැදිලි ලෙසම වර්තමානයට ගෙනඑයි:

අදත් හංගාගෙන බඩක්
ටකරන් පලුව වසාගත්ත ගැහැණියක්

ඉදිරිපස බිත්තියේ
නිදන බේබද්දාගේ හිසට ඉහලින්
කොළපාට නිල්පාට පසුබිමේ
හිනාවෙන මූණක් දෙකක්
පසෙකින් ලියා තිබේ
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
අහවලාගේ තවත් ප්‍රජා සත්කාරයක්

මහජන මුදලෙන් ගොඩගන බස් නැවතුම් පොලවල්, වැසිකිලි, විදුලි පහන් කණු, මං මාවත් ආදී සියල්ලම තමන්ගේ ධන පරිත්‍යාගයෙන් හෝ රජයේ විමධ්‍යගත අරමුදල්වලින් තම මැදිහත්

වීම හරහා මහජනතාවට ලබා දුන් දායාද බව පවසන ජාතික හා ප්‍රාදේශීය දේශපාලකයින්ගේ කයිවාරු පුවරු අප කොතෙක් දක ඇත්ද? මීට සාපේක්ෂව දකගත නොහැක්කේ රටට දැරිය හැකි හා සුදුසු ආධ්‍යාත්මක හා භෞතික සංවර්ධනයයි. වර්තමානයෙන් බැහැරව, අතීතයේ සංකේත ක්ෂේත්‍රයක් මධ්‍යයේ වුවද කවියා 'පරාජිත පෙම්වතෙකු අප්සරාවිය හමුවීම' යන කවිපන්තියෙන් පවසා සිටින්නේ අතීතය, ඉතිහාසය හා පොදු මතකය කරලියට නංවන විට මතුවන විස්මෘතිය පිළිබඳ දේශපාලනයයි. එනම්, අපගේ සභ්‍යත්වමය කතිකාවලින් අප මතක තබා ගන්නේ හා අමතක කරලන්නේ කුමක්ද හා ඒ වරණයට හේතුව කුමක්ද යන කාරණාය:

**ආදරය ළඟ පැරදිලා නැති**
**කිසි කෙනෙක් හමුනොවුණ හින්දා**
**සීගිරිය නැග අප්සරාවිය**
**හමුවෙන්න මට හිතක් දුන්නා**

**මල් මිටක් ගෙන හුදෙකලාවේ**
**මඟ බලාගෙන ඉන්න හින්දා**
**කල්පනාකර කනට ළං වී**
**පෙම්වතෙක් ඉන්නවද ඇහුවා**

**බොහොම ඉස්සර වැවට අද්දර**
**මටත් යස පෙම්වතෙක් උන්නා**
**ඇය කියද්දී හිතට රහසින්**
**ඇස් දෙකෙන් මගෙ කඳුළු පැන්නා**

**සීගිරිය කළ රජෙක් දවසක්**
**මගේ රූපෙට හිතක් බැන්දා**
**ගල් ලෙනක මම වින්ද කරදර**
**වහන්නට සිතුවමක් ඇන්දා**

සීගිරිය, අනුරාධපුරය, පොළොන්නරුව වැනි අතීත ශ්‍රී විභූතිය ගැබ්වී ඇති නශ්ඨාවශේෂ පිළිබඳව උදම් අනන විටදී එවන් භෞතික දෑ ශේෂකරලන්නට නම් කුමනාකාරයෙන් මහජනතාව

පැරණි රජ දවසේ හසුරුවන්නට ඇත්ද, ඒ සඳහා කුල ක්‍රමය හා රාජකාරී ක්‍රමය මගින් ශ්‍රමය කුමන ලෙසකින් සූරාකන්නට ඇත්ද යන්න අප මොහොතකට හෝ සිතන්නේ නැත. එනිසාම, අපගේ වංශකථාවලින් ඉදිරිපත්කරන ඉතිහාසයන්ට අමතරව අනේක නිර්ප්‍රභූ ඉතිහාසයන් අපගේ සවිඥානයෙන් කොතෙක් ගිලිහී ඇත්ද යන්න අප සිහිපත් කළ යුතුය. මන්ද, මේ සීමාව නිසාම අපගේ සමස්ථ ඉතිහාසය තේරුම් ගැනීම යම් බුද්ධිමය දරිද්‍රතාවකින් වැසී ඇති බැවින් අප අතීතය තේරුම් ගන්නා ආකාරය අසම්පූර්ණ වන නිසාය. කෙසේ වුවද, කවියා සීගිරි යුගයට අපව කැඳවාගෙන යන්නේ වර්තමානයේ සිට බැවින් ඔහු සංකේතාර්ථයෙන් හා පරිකල්පනයෙන් මෙසේ ගොතන කතිකාව වර්තමානයේ බලදේශපාලනයටද එලෙසින්ම සාධාරණීකරණය කළ හැකි බැව් අපගේ පොදු අත්දැකීමෙන් අපට තේරුම් ගත හැකිය. ස්වභාවධර්මය හා ඊට එරෙහි මානව ක්‍රියාකාරකම් ශ්‍රී ලංකාවේ මෑතකාලීන ඉතිහාසයේ එක් මහා ඛේදවාචකයක් වන්නේ හුදු පටු පුද්ගලික අවශ්‍යතා හෝ මූල්‍යමය වාසි සඳහා ස්වභාවධර්මයට එරෙහිව ජනතාව විසින් දියත් කර ඇති අනවරත සටන් හා ස්වභාවධර්මය විසින්ම ඊට ලබා දී ඇති විනාශකාරී පිළිතුරු මගින් මූර්තිමත් කරන යතාර්ථයයි. 2017දී සිදුවූ ජලගැල්මෙන් හා නායයෑම්වලින් ලංකාවේ පුද්ගලයින් 151 පමණ මිය ගියහ.[16] ඒ 2003 න් පසුව ඇතිවූ දරුණුතම ජලගැල්ම වීය. විනාශය මෙතරම් නොවුනද, 2018දී ඇතිවූ ජලගැල්මෙන් හා නායයෑම්වලින් ද මිනිස් ජීවිත හා සම්පත් විනාශ විය. එක් අතකින්, නිරන්තරව ඇද හැලෙන වර්ෂා වැනි ස්වභාවධර්මයේ ඇතිවී තිබෙන දරුණු වෙනස්වීම් ගෝලීය වශයෙන් සිදුවී ඇති මහා-පරිමාණ මානව විනාශකාරී ක්‍රියා වල ප්‍රතිඵලයකි. අනෙක් අතට, මෙවන් වැසි තත්ත්ව යටතේ සිදුවන නායයෑම් ආදියට ලංකාවේ සිදුවන වන හා වෘක්ෂලතා විනාශය මෙන්ම කඳුකර ප්‍රදේශවල ඊනියා සංවර්ධන කටයුතු හා පුද්ගලික නිවාස ඉදිකිරීම සඳහා මහා පරිමාණ වශයෙන් සිදුකරන වනපෙත් එළිපෙහෙලි කිරීම් ඍජුවම දායකවී තිබේ. මෙනයින් බලන කල මෙවන් සිදුවීම් ගෝලීය හා දේශීය වශයෙන් සිදුකරගන්නා සාමූහික සියදිවි නසාගැනීම් වශයෙන්ද තේරුම් ගත හැක. මේ තත්ත්ව දේශීය වශයෙන් පාලනය කරගැනීමට රජයට මෙන්ම

16. https://www.theguardian.com/world/2017/may/28/floods-and-landslides-and-in-sri-lanka-kill-at-least-150-people

මහජනතාවටද අපහසුවී ඇත්තේ ඔවුන්ගේම අදූරදර්ශී ක්‍රියාවන් නිසාය. ස්වභාවධර්මයට මෙලෙස සිදුකරන හානියද සොබාදහමින් ලැබෙන විනාශකාරී ප්‍රතිචාරද හෙට්ටිතන්ත්‍රීගේ කවියට පදනම සපයන තවත් තේමාවක්ය. 'කඳු පන්තියක රැස්වීමක්' යන කවි පෙළේ මුඛ්‍යාර්ථය නම්, සීමා රහිත වන විනාශය දරාගත නොහැකි වූ කඳුයායක් නායයාමට ඒකමතිකව තීරණය කිරීම හා සප්තකන්‍යා කඳු පෙලින් ඇතැමුන් ගිනිකඳු බවට පත්වන්නට තීරණය කිරීමත්ය:

ඉවසන්න බැරිම තැන
පපුවේ කැක්කුම
මිට මොලෝ ගත්තේ නකල්ස් කඳු
කිරි දෙද්දි ඇකයේ
අම්මෙක්ගේ පයෝදර
පිටපලු වලට ඉරා
කැන්ටර් වධකයෙක්
පැගුවේ තේක්ක බිළිඳු

හැම තැනම මිනී කඳු
මැෂින් කියතත් බෙලි කපා ළඳු
ජාතියම වළලද්දි
බෝ ගස් වලට තියෙනවා
පැන් කල පිටින් නාන කැත පුරුදු

පොළොවට නොබැස
අතුරුදහන් වන්දි දෙන්නට
අහසක් පත්කරද්දි කේඩෑරි වැහි බිඳු
කඳු තට්ටයක ඉපල් කෙස් ගහක
එල්ලී මැරෙන්නට පෙර
හා කුණක් බදාගෙන ඉකිගහයි සඳු

මධ්‍ය කඳුකරයේ
රැස්වීමක් කැඳෙව්වේ
තීරණය කරන්නට නාය යන කඳු
සප්ත කන්‍යාවෝ යෝජනා කළේ හඬා
අපිවද කෙලෙසූ නිසා
කට්ටියක් හමු වෙමු කියා ගිනි කඳු

මෙතරම් විනාශයක් සිදුකරන ඇතැමුන් බෝ ගස් නහවමින් කරන බෝධි පූජා කවියා දකින්නේ කුහකත්වය උද්දීපනය කරන යාතුකර්මයක් විලසිනි. ඒවා 'කැත පුරුදු' ලෙස දකිමින් හාස්‍යයෙන් යුතුව ඔහු බැහැර කරන්නේ මේ නිසාය. 'බහුතර ගස්' නම් වූ කවි පෙලින්ද ඔහු උත්සාහ දරන්නේ මේ තේමාවම ආමන්ත්‍රණය කිරීමටයි:

**ගල් බොරලු වහගෙන**
**කඩතොළු හංගාගෙන**
**පා පහරවල් ඉවසා ගත්තා**
**හැමදම තණ නිල්ල**
**ඒක අනුකම්පාවට කරුණක් නෙමෙයි**
**විසිකැත්තට නොකපන්නට**
**තණ පතක බෙල්ල**

**වැල්ලේ ඇස් අරින්නට හදන**
**කිසිම පැලයකට**
**අවස්තාවක් දෙන්න**
**සූදානම් නෑ රැල්ල**
**ටිකක් කල් ජීවත් වෙන්න**
**පොල් ගහක් පවා**
**මුහුදට පාත්කරගෙන**
**ඉන්න ඕනා බෙල්ල**

මේ කවි පෙළෙන් කවියාගේ කරුණාව සැමගේ පය ගැටෙන තණපෙති දක්වා ද විහිදී යන අතර, සොබාදහමේ පැවැත්මට මානව ක්‍රියාවලීන් මෙන්ම සොබාදහමම නිශේධනීය බලපෑම් එල්ල කරන ආකාරය පැහැදිලි කරයි.

## සමාප්ති සටහන්

මේ කවි එකතුවේ ඇතුලත් වී ඇති සියළුම කවි ඉහත මා ඉදිරිපත් කර ඇති තේමා හතර හෝ ඒවාට බෙහෙවින් සමීප අදහස් ඔස්සේ ලියැවී ඇති බැව් මාගේ විශ්වාසයයි. එමෙන්ම මේ තේමා සියල්ලම ඔස්සේ දිවෙන තවත් සමස්ථ අදහසක් මේ සියළුම කවි තුළ සෙවනැල්ලක් සේ දකගත හැකිය. එය දෛවය

හා කර්මය අතර දෝලනය වන අදහසකි. එනම්, හෙට්ටිතන්ත්‍රීගේ විචාරය, වේදනාව, කෝපය, කරුණාව, හාස්‍යය හා ගර්ජනාව ඔස්සේ පෙනෙන්නේ ඔහුගේ කවිවලින් විස්තර කරන ශ්‍රී ලාංකේය සමාජයේ පවතින අනේක බේදවාචක ඓතිහාසිකව මුල්බැසගෙන ඇති බැවින්, එයින් මිදෙන්නේ කෙසේදැයි කවියාට නොපෙනෙන බවත්ය. කවියාට පමණක් නොව, බොහෝ කාලයක සිට ශ්‍රී ලාංකේය සමාජය විධිමත්ව හදාරන මා වැන්නෙකුට වුවද මේ පවතින තත්තවයන්ගෙන් එතෙර වන්නේ කෙසේ ද හා එසේ එතෙර විය හැකිද යන්න නිරන්තරයෙන්ම පැනනගින ගැටළුවකි. එයයි සමස්ථ ලාංකේය දේශපාලනය සහ එහි පැවැත්මට නිරන්තරයෙන් හා මුග්ධව එක්ව ජවය සපයන සාමාන්‍ය ජනතාව හා ඔවුන්ගේ නායකයින්ගේ අනාගත දැක්ම කියවාගැනීමට ඇති නොහැකියාව නිසා ඇති වූවක් යැයි මාගේ විශ්වාසයයි. කෙසේ නමුත්, මේ දෛවමය හා පවතින තත්ත්වයෙන් ගොඩ ඒමක් නැත්තේය යන අදහස වඩාක් ප්‍රකට වන්නේ මේ සමස්ථ කවි එකතුවටම එහි නාමය සැපයූ 'සන්දේශ යවලා බෑ කපුටන්ට ගොඩ එන්නඃ කරන්ට් කම්බියක් උඩදි කපුටෙකු කළ කතාවක්' නම් කවි පන්තියෙන් වේඃ

මොණරු හංසයො ගිරව්
සැළලිහිණි කොවුලෝ සැවුලෝ
මුළු ඉතිහාසයෙම කළේ
කපුටන්ට ඇන්දිල්ල
උන් උස්සගෙන ගිය
කිසි සන්දේශයක තිබුණෙ නෑ
කපුටන්ගේ දුක් ගැනවිල්ල

දඹදෙනි කෝට්ටේ සීතාවක
හැම රාජධානියකම
මුන් ටිකම තමයි රිංගුවේ හැමදාස රජ වාසලට
කපුටු පැටව් හාමතේ අඬද්දී
උන් කළේ රජවරු රැක ගන්න
දුවපු එක උපුල්වන් විභීෂණ
සමන් දේවාල වලට

**ලැබෙන වරදාන වලට**
**රාජ වංශයේ කුමාරිකාවකට**
**මිනිහෙක් හොයන්න**
**තවත් බිසවකට**
**බඩට ළමයෙක් ඉල්ලන්න**
**පරවි මුත්තෙක් සහ සැලළිහිණි අත්තෙක්**
**දෙයියන්ට කියපු ඉතිහාසයක් තියෙනවා**
**අපේ නායක කුරුල්ලන්ට**

**තාම එක කපුටෙකුට බැරිවුණා**
**වහලක් තියෙන කූඩුවක මැරෙන්න**
**අඩු ගානේ අපිට අයිතියක් නැද්ද**
**ඔළු ගෙඩියකට නොවැටෙන්න**
**නිදහසේ පොළොවට කක්කුස්සි යන්න**

පැහැදිලිවම, හෙට්ටිතන්ත්‍රීගේ කපුටෝ අපි සැම වන අතර මොණරු, හංසයෝ, ගිරව්, සැළලිහිණියන්, කොවුලන් හා සැවුලන් වැනි පක්ෂී ධූරාවලියේ ඉහල ස්ථරවල වැජඹෙන කාව්‍යමය වශයෙන් සිංහල කාව්‍යකරණයේදී ඓතිහාසික වශයෙන් වරප්‍රසාධිත පක්ෂීන් එදත් අප පාලනය කළ හා අදත් අපව පාලනය කරන පාලක පන්තියයි. ඔහු දකින ලෙස මෙය යාවත්කාලීන යථාවකි.

මා මෙතෙක් උත්සාහ ගත්තේ සුජීව හෙට්ටිතන්ත්‍රීගේ 'සන්දේශ යවලා බෑ කපුටන්ට ගොඩ එන්න' යන මේ කවි එකතුව කියවීමේදී යොදා ගත හැකි එක් ප්‍රවේශයක් පිළිබඳව මාගේ විෂය ක්ෂේත්‍රය ඔස්සේ අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්නටය. අන් පාඨකයින්ට මෙය වෙනත් ආකාරවලින්ද කළ හැක. මෙහිදී මා අදහස් කළේ කවියට සමාජවිද්‍යාව හෝ අන් සමාජයීය විද්‍යාවන් විස්තාපනය කල හැකි බව කීමට නොවේ. යම් පැහැදිලි තත්ත්ව යටතේ ගන්නා ලද ඡායාරූප සමාජවිද්‍යාවට විධික්‍රමිකව හෝ පර්යේෂණ ඉලක්කයක් වශයෙන් හෝ පැහැදිලි දිශානතියක් සැපයිය හැකිය යන්න ඒ පිළිබඳව රචනා කළ සියළුම රචනයන් තුළ මා තර්ක කර ඇත්තේ යම් සීමාවන් තුළය. එනම්, ඡායාරූපවලට මේ හැකියාව ලැබෙන්නේ ස්වාධීන මූලාශ්‍රයක් වශයෙන් පමණක් ඒවා සැලකිල්ලට ගැනීමෙන් නොවේ. ඒවාට මේ හැකියාව ලැබෙන්නේ අන් සියළුම මූලාශ්‍ර මෙන්ම සමස්ථයක් වශයෙන් පාඨාන්තරීය කියැවීමකට අවකාශ

විවර කල හැකි මූලාශ්‍ර සමූහයක් අතර පවතින එක් මූලාශ්‍රයක් ලෙස ගත් විටය.[17] මෙලෙසම, සමාජයීය විද්‍යාවන්ට නිර්මාණශීලී ලෙස ඇදාගත හැකි අන් සියළුම නිර්මාණ කෘති මෙන්ම කවියද එසේ ඇදාගත යුත්තේ එයින් අන් මූලාශ්‍රද සමගින් සමාජය හා එහි දේශපාලන ගතිකයන් හා සංස්කෘතික ප්‍රවණතා කියැවීමට යම් දායකත්වයක් සැපයිය හැකිනම් පමණි. ඒ වරණය හා එය ක්‍රියාත්මක කළ හැකි තත්ත්ව පිළිබඳ තීරණ ගැනීම විචාරශීලී සමාජවිද්‍යාඥයා සතු කාර්යයකි. මේ අර්ථයෙන් ගත් කළ, මා ශ්‍රී ලාංකේය සමාජය පිළිබඳව හෝ පුළුල් වශයෙන් දකුණු ආසියානු සමාජය පිළිබඳව හෝ පාඨමාලාවක් උගන්වන්නේ නම්, 'සන්දේශ යවලා බෑ කපුටන්ට ගොඩ එන්න' යන සුජීව හෙට්ටිතන්ත්‍රීගේ කවි අගනා ප්‍රවේශ හා සාකච්ඡා අවකාශ ගණනාවක් සපයන බවට මට කිසිදු සැකයක් නොමැත.

**- සසංක පෙරේරා**

සමාජවිද්‍යා අධ්‍යයනාංශය,
දකුණු ආසියානු විශ්වවිද්‍යාලය,
චානක්‍යපුරි,
නව දිල්ලිය.

17 නොවැම්බර් 2019.

---

17. මේ පිළිබඳ අමතර තොරතුර සඳහා කියවන්න: Sasanka Perara, ‘Photography’s Methodological Absence in Social Anthropology in South Asia: Some Preliminary Thoughts for Consideration,’ pp. 299-319. In. N. Jayaram ed., Knowing the Social World: Perspectives and Possibilities. Hyderabad: Orient BlackSwan, 2017 iy Sasanka Perara, ‘Photography and the Ethnographic Method.’ In Oxford Research Encyclopedia of Education. Oxford University Press. doi: http://dx.doi.org/10.1093/acrefore/9780190264093.013.379, 2019.

## පටුන


01. මේ ගලන්නේ ඒ ගඟමයි **33**

02. කඩා ඉවත් කිරීමට නියමිතව...... **34**

03. නෙළුම උත්කර්ෂයට නඟන....... **35**

04. නැවතුණේ නෑ අම්මා **36**

05. ගහක් මුදුනට සඳත් නැගලා **37**

06. පරාජිත පෙම්වතෙකු අප්සරාවිය හමුවීම **38**

07. කඳු පන්තියක රැස්වීමක් **39**

08. ගණිකාවගේ මිනිහෙක් **40**

09. පොදු වැසිකිළිය **41**

10. සඳකඩ පහන අනිත් පැත්ත හැරවූ පසු...... **42**

11. ෆයිනස් ගස් සහ කඳු **44**

12. මෝහිණී නෙමෙයි අම්මේ මං **45**

13. කලා වැවත් අම්මෙක් **46**

14. බහුතර ගස් **47**

15. සන්දේශ යවලා බෑ කපුටන්ට ගොඩ එන්න **48**

16. මෝචරිය ඉදිරි පිටදී...... **50**

17. මරන්නට මොහොතක පෙර....... **51**

18. වැව් බැඳි රාජ්ජේ ජන කතාවක් **53**

19. කටු පඳුරක් තෘණ අමතයි **55**

20. ගැටකපන්නා, බිරිඳ සහ ගැට **57**

21. අම්මාගේ වල ළඟදි **58**

22. අද පාඩම මයි සෙල්ෆ් **60**

23. අම්මේ මම අන්තිම ඉන්ටව් එකත් ෆේල් **61**

24. ඕස්ට්‍රේලියානු වෙරළට...... **62**

25. නංගී එල්ලුන ගස යටදී **64**
26. වල්ලිඅම්මාගේ මරණය **65**
27. නෙළුම්ය **66**
28. කුසුමක්දෝ ඔබ **67**
29. වෙස්සන්තර රජෙක් වෙන්න...... **68**
30. මුහුදෙන් ගොඩ ඇමූ කිඳුරියක් **69**
31. වවුලාගේ මරණය **70**
32. පතිනි සළුව **72**
33. කෑල මලක් **73**
34. දුවේ දැන් ගෙදර යමන් **74**
35. මැයි විරු රැස්වීමට පසු **75**
36. වී **76**
37. පශ්චාත් අවුරුදු සිද්ධි **77**
38. අපි දෙන්නා සහ බැද්ද **79**
39. උසාවිය පොලිසිය සහ මුහුද ළඟ රෑ....... **80**
40. කෙල්ලක් කෝච්චියට බෙල්ල තියද්දී...... **81**
41. පනික්කියාගේ දුක්ගැනවිල්ල **82**
42. ආදරය කියන්නේ **83**
43. රේල් පාර ළඟ ටැප් එක **84**
44. ඔබ නිසා මම ද කතුවරියක් වුණෙමි **86**
45. මගෙ දුවේ **87**
46. මනමේ කෝලම **88**
47. මුහුදු හතකින් පැන්නෙ අම්මා **89**
48. කිරි කැටි දූට වැදුම් ගෙදරදි අම්මා කිවු කවි **90**
49. කඳුකරේ කඳු අතේ නැති කවියක් **92**

## 01. මේ ගලන්නෙත් ඒ ගඟමයි

මේ ගලන්නෙත් ඒ ගඟමයි කාටත් හුරු
විසිකරයි දියට මල් උපද්දා දැලේ තුරු
කව්ඩෙකු ගිලිද්දි මරු ගීයක් ගයයි මෙරු
"අපට පැයුවත් එකයි නැතත් එකයි හිරු"

වැහි වලවක් කියා කියාගෙන ගිය
පහුගිය සුළන් කිව්වෙම කපටි බොරු
දැලේ බෙදි රෑම කැගැහුවට රෑහැයියෝ
මේ දෙකම එකම ජාතියෙ ඉවුරු

අවුරුදු හැට හැත්තෑවක් පරණ පාලම
තවත් උස්සගෙන ඉන්න ඕනමද මේ කරු
ගෝඩා හැලියක ගිලුණු ගෙම්බෙක් අහන
මාර දාර්ශනික ප්‍රශ්නයක් ඒක මරු

පොරි අතක් බොර දියට විසිකර හැමදාම
දියට බහින්නෙ එකම දැලක ර්යම් බරු
ගුරු වගේ නම් දැම්මාම ඒ වගේ කාරණා
මේ ගඟට තේරුම් කරයි හෙන ඈත තරු

පැල්පත් බිඳ පටවාගෙන පහුරු වල
රැල්ලේ පහල යයි මේ ඇනුත් පල් හොරු
උල්පත් හොයාගෙන උඩුගම් බලා යන්නේ
කවදාද ඇත්තටම මේ ගඟේ ඔරු

02. කඩා ඉවත් කිරීමට නියමිතව තිබූ
පැල්පත් පේලියේ කොලුවෙකු
පාරේ කුණු අතගාන අම්මෙක්
ළඟට දිව ගොස් හදිසියේ කිවූ කවියක්

අම්මෙ ටකරමක කණට ගහලා
ඩෝසරේ මේ දැන් ගෙට ගොඩවුණා
බිත්තියේ හිටපු සමන් දෙයියන්ව
එක කටට උෟට මදි වුණා

ඉටි කොල කෑලි පිට පලු ලෑලි
පාර මැද්දේ සිහි නැති වුණා
හිටි හැටි තැන් වලම පැලේ කණු ටිකට
සට සට ගාලා චූ වැහුනා

කරවටක් මිරිස් හොද්දේ හිටපු පියාමැස්සා
කරමලෙන් වැට මාර අත්තක එල්ලලා
ජර ජරස් ගාලා අන්තිමට මට කතා කරපු
පැල මං එද්දි කට ඇදවෙලා ගොතවෙලා

යටලීය හපල ඩෝසරෙ කිරි වේයෝ බොද්දී
මඩ වලේ අක්කා ගෝනියක ගුලිවුණා
අම්මෙ මං මේ උෟට කියල ආවේ
“යකෝ ඊයේ රෑ අපේ අක්කා ලොකු වුණා”

## 03. නෙළුම උත්කර්ෂයට නඟන ගෙම්බන්ට ගෙම්බෙක් අනතුරු අඟවයි

කිසි දැනුම් දීමකින් තොරව
කොන්ක්‍රීට් වලින් පිරෙව්වේ
ගෙම්බන්ගෙ මඩවල
ඊට පස්සෙයි ඉස්ම ටික උරාගෙන
පැල්පත් මරාගෙන
පීදුනේ මේ නෙළුම් මල

පාදම් යටම අඩියේ
පෙට්ටි කඩවල සමූහ මිනීවල
තිත්ත කුණුහරුප කියාගෙන පැන්න
ඩෝසර් වලට පෑගුනා
රෙද්ද මැත්කර බඩදරු ගෙම්බියෝ
හැවදාන්නට ඇලවුන ඇල

හද්ද පිටිසර වැවක
කොළඹ ආ ගෙම්බෙක් මතකයිද
නෙළුම් නටුවෙන් රූටලා මළ
ඇත්තටම තොපි හිතනවද
ඉදිරියට එන ඉඩෝරයට
හාරගෙන හරි කන්න
ඕකෙ බහියි කියා නෙළුම් අල

පුප්පා සුවඳ බීගත්
හුළඟ ගෙනත් අතැර අවසන්
ගෙම්බන්ගෙ කුණු ඇලට
මල පුප්පන්න ගිය බිල
උඩින් මඩේ මලක් ගැහුවට
ඇයි ගෙම්බන්ට තේරුම් ගන්න බැරි
විලක් නොවනා බව උන්ගෙ වල

## 04. නැවතුනේ නෑ අම්මා

අවාරේ මහ අනෝරාවක
තෙමී සමනොල කන්ද නැගලා
මගේ හිස සිරිපතුලෙ ගාවා
නැවතුණේ නෑ අම්මා

උදැසන කඳු තිල්ලෙ දුවලා
මියුරු එල ගෙන තුඩග තියලා
ළපටි ඉර මල නෙලා ගන්නට
අහස දෝතට ළං කළා

මහා ගංගා හුස්ම ගන්නා
නොසිඳෙනා දියකඳුර සොයලා
සෙනේ ලේ කිරි එයින් තවරා
නැවතුණේ නෑ අම්මා

සිඟිති දිය උල්පතක් පෙන්නා
ගඟක් වෙන හැටි හිතේ අන්දා
මහා ගල්කුළු කඳු කපා
මුහුදටම යන පාර කිව්වා

වැටෙන සඳරැස් මිටක් අහුලා
වළාකුලකින් කඳුළු දොවලා
මගේ ලෝකය පාට කරලා
නැවතුණේ නෑ අම්මා

කන්ද පාමුල මතක් කරලා
ලන්ද පාමුල ගහක් වීලා
ළඟින් දළඳා සමිඳු තියලා
පිරිත් කියනව තාම අම්මා

## 05. ගහක් මුදුනට සඳත් නැගලා.....

සන්හිඳේ දෙවියන්ගෙ පාමුල
කඳුළු තියලා එන වෙලේ
වැව් කොනේ තනි එකා ඉඳලා
දිවුල් හෙව්වද උඹෙ බඩේ

අඳුර ඇඳගෙන ඇත්තු ඇවිදින
හරිම මූසල මංඩියේ
වැවේ දෙවියනි මේ තියෙන්නේ
අපි උදේ කෑ වැල් අලේ

රැහැයියෝ ඔය ජප කරන්නේ
වැදුම් ගෙදරක මන්තරේ
පොඩි එකා ඇහැ පියාගන්නැති
දකින්නට පෙර කිරි කලේ

වී දෙපැලක් උගස්කරලා
ගෙනැත් ඇති පංචායුදේ
අලි හිතක් ඇයි අඩිය තිබ්බේ
පොඩි පුතා සැතපුණු කුසේ

කණාමැදිරියො එළිය නිවලා
ගුලිවෙලා ඇති මයෙ පැලේ
ගහක් මුදුනට හඳත් නැගලා
බලා ඉන්නැති මර බයේ

මිරිස් හේනක දුවපනින්නට
පුතත් එක්කලා මහ වනේ
නංගියේ උඹ ඇවිත් යනවද
හීනයක හෙට කළුවරේ

## 06. පරාජිත පෙම්වතෙකු අප්සරාවිය හමුවීම.....

ආදරය ළඟ පැරදිලා නැති
කිසි කෙනෙක් හමුනොවුණ හින්දා
සීගිරිය නැග අප්සරාවිය
හමුවෙන්න මට හිතක් දුන්නා

මල් මිටක් ගෙන හුදෙකලාවේ
මඟ බලාගෙන ඉන්න හින්දා
කල්පනා කර කණට ළංවී
පෙම්වතෙක් ඉන්නවද ඇහුවා

බොහොම ඉස්සර වැවට අද්දර
මටත් යස පෙම්වතෙක් උන්නා
ඇය කියද්දි හිතට රහසින්
ඇස් දෙකෙන් මගෙ කඳුළු පැන්නා

සීගිරිය කළ රජෙක් දවසක්
මගේ රූපෙට හිතක් බැන්දා
ගල්ලෙනක මම වින්ද කරදර
වහන්නට සිතුවමක් ඇන්දා

## 07. කඳු පන්තියක රැස්වීමක්

ඉවසන්න බැරිම තැන
පපුවේ කැක්කුම
මිට මොලෝ ගත්තේ නකල්ස් කඳු
කිරි දෙද්දි ඇකයේ
අම්මෙක්ගේ පයෝදර
පිටපලු වලට ඉරා
කැන්ටර වධකයෙක්
පෑගුවේ තේක්ක බිළිඳු

හැම තැනම මිනී කඳු
මැෂින් කියතක් බෙලි කපා ලඳු
ජාතියම වලලද්දි
බෝ ගස් වලට තියෙනවා
පැන් කල පිටින් නාන කැත පුරුදු

පොළොවට නොබැස
අතුරුදහන් වන්දි දෙන්නට
අහසක් පත්කරද්දී කේඩෑරි වැහි බිඳු
කඳු තට්ටයක ඉපල් කෙස් ගහක
එල්ලී මැරෙන්නට පෙර
හා කුණක් බදාගෙන ඉකිගහයි සඳු

මධ්‍ය කඳුකරයේ
රැස්වීමක් කැඳෙව්වේ
තීරණය කරන්නට නාය යන කඳු
සප්ත කන්‍යාවෝ යෝජනා කළේ හඬා
අපිවද කෙලෙසූ නිසා
කට්ටියක් වෙමු කියා ගිනි කඳු

## 08. ගණිකාවකගේ මිනිහෙක්

එක් නාලිකාවකින්
තවත් නාලිකාවකට
එෆ් එම් තරංග ඔස්සේ
හක්ගෙඩිකාරයා දුවයි

අඟල් දාහතරේ පිරිත් මණ්ඩපේට
වැඩමකළ හාමුදුරුවරු
ඉරුණු සරමෙන්
ඔළුව උස්ස උස්සා මග බලන
කේඩෑරි ලිංගය
සෝවාන් කරන්නට බණ කියයි

වටවල තේ හදන කෙල්ල
ආටානාටිය මැදට
පැන්නෙ නැත්නම්
මෙලහටත් හීනෙන් රමණය තමයි

කේන්දරකාරයෙකුගෙ ගුවන් කාලය
දැන් රාහු කාලය
එළියට බහින්න එපාලු
"යකෝ මට චූ බරයි"

"සමදරා සැලයටත් කලින් ඔයා ආවද
සිගරැට් බුලත් ගංජා කහට
තන කිරි එක්ක ගිලුනොත්
පුංචි පැටියට වහ තමයි"

## 09. පොදු වැසිකිළිය

අදත් හංගාගෙන බඩක්
ටකරන් පලුව වසාගත්තා ගැහැණියක්

වතුර බාල්දියක්
උප්පැන්න නොලියා
මරණ සහතිකය ලියනකම්
බිළිඳෙක් අම්මෙක්ගෙ තන පුඩුව සෙවූ
තොටිල්ලක් මේ කක්කුස්සි කටත්

කරවටක් උස තාප්පය උඩ
ඉසෙඩ් ඉස්කෝ් එකට නැති ප්‍රශ්න
පෙරළ පෙරළා වටපිට බලන කොපි පොතක්
සමර නැත්නම් අමරණීයයි
කන්‍යාපටලයකින් වැටුණු ලේ බිඳක්

ඇඳිරිය මුත්‍රා කරන්නට පවා
ඇඳිරි නීතිය දැමූ සවසක්
ස්ත්‍රී නිමිත්තක් බරපතළ වැඩ ඇතිව හිරේ
ගෙදර ළිප් ගල් තුනට
ගෙනියන්න හාල් තුනපහ ටිකක්

ඉදිරිපස බිත්තියේ
නිදන බේබද්දාගේ හිසට ඉහලින්
කොළපාට නිල්පාට පසුබිමේ
හිනාවෙන මූණක් දෙකක්
පසෙකින් ලියා තිබේ
ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ
අහවලාගේ තවත් ප්‍රජා සත්කාරයක්

## 10. සඳකඩපහණ අනිත් පැත්ත හැරවූ පසු ලියා තිබූ සෙල් ලිපියක්

අටමස්ථානේ අද්දර
අන්න අර වැවේ
මඩෙන් එළියට
මල්වර වුණා විතරයි ඒ නෙළුම්
පෙති දිග ඇරෙන්නටත් කලියෙන්
පැහැරගෙන ගියේ
බිසෝ මාලිගයට ඒ නෙළුම්

මාලිගේ වටේටම එලා ගිනිදැල්
අන්තප්පුරේදී තමයි
පෙති සීය පිප්පුවේ බලෙන්

සිංහ නිය ළපටි පෙති වලට දුන්නා
සදාකාලික පැලුම්
මද කිපුණු ඇත්තු අශ්වයෝ ගොන්නු
බැලුවේම සරාගික බැලුම්
අවසානේ තුඩින් ගෙන
හොඳටෝම හප කළේ
එක වැවේ එකට උන් හංසයෝ නෙළුම්

සිහිසුන්ව ඉඳිද්දී දිය පොදක් දී
ලියවැක් තමයි පිරිමැද්දේ තැලුම්
එයින් ඉක්බිතිවයි ඉස්සරහ පඩියට
විසිකළේ සුදු නෙළුම්

අවසන් වරට මට හමුවුණේ
හරියටම හරි මැදින්
කැපූ පලුවක් විදියට නෙළුම්
සඳකඩපහණ මම නෙළුවේ ඒ නෙළුම්

මං දන්නවා
දවසක පුරා විද්‍යාඥයෙක් කියයි
රාග ද්වේශ මෝහයෙන් මිදී
ජාති ජරා ව්‍යාධි මරණයෙන් කෙළවර
තෘෂ්ණාව දුරු කර
උතුම් නිර්වාණ සමාපත්තියට
එළඹුන බව මගෙ නෙළුම්

## 11. පයිනස් ගස් සහ කඳු......

කඳුකරේ ඉදිකළ පසු උදාගම්
ගස් වලට පයිනස්
මුළු රීරිමාංශයම
උන් උරා බිව්වා
තට්ටුවේ හියුමස්

යටිරෝපණය මියැදෙන්න පෙර
ලතාවක් ගහක හේත්තුකර
රමණය කළ ඒ සුන්දර දවස්
හුදකලා කටු පඳුර මහල්ලෙකු
මතක් වී තෙත් වෙයි දෑස්

වතු වගාවට දූෂණය කළ
කඳු කෙල්ලන්ගේ
ස්ත්‍රී නිමිත්තෙත් වවා තිබුණා තේ ගස්
අදටත් ප්‍රසිද්ධ රහසක්
ඉතිරි පලු වීර කුඹුක් ගස් වල
අතපය කපා පැහැරගෙන යද්දී
ජාතික වඩුමඩුවේ එවකට උන් වඩු බාස්

සරු පසක් ගැන නොවෙයි
පයිනස් ගස් හිතන්නේ වෙන්න උස්
හැත්තෑ හතෙන් පසු මොරටුවේදි
දඬුකඬේ ගසා මරා ඇමුවා
ඇත්තටම අත් පටලවාගෙන මේ කඳුවලට
ආදරේ කළ ගස්

මහා වරුසාවක් කියන්නේ
දැන් මේ කඳු ගම් වැදි
මිනීමරනා දවස්

# 12. මෝහිණී නෙමෙයි අම්මේ මං

දෙගොඩහරි යාමෙට
එගොඩ වුණේ පාලු පාරට
ගමම ඇයි බයෙන් මේ දුවන්නේ

නෙමෙයි මං මෝහිණී
පොඩි එකී රෝහිණී
නවතින්න නවතින්න අම්මේ

කුසට විළිබර ඇනෙද්දී
ලිපට කර පුළුටු ගිනි පිඹිද්දී
කැඩෙනකම් ගැහුවා වැට ඉනි
කුලීගෙයි දොර වසා ගාමිණී
අඟුලිමල් පිරිත වෙනුවට
දෙසා නින්දා යාදිනී

දෙවට තිඹිරි ගේ වූ
බට ගහක් පෙකණිය කපා
වින්නඹු අම්මෙකුට පණ දුනි

ගමට මිනී කන යක්ෂණී
තාමත් අම්මේ පත්තිනි

## 13. කලා වැවත් අම්මෙක්

**දළ පූට්ටුවා ඝාතනය කරයි - පුවතක්**

දළදා හාමුදුරුවනේ
මරලා මගේ ලොකු කොලුවා
වල දා නැති මළකුණ මූකලානේ
වලඟා අව් වැසි තිබුණා

පළඟා ලා දළු තාවුල්ලේ
පෝය දෙකක් මං මග බැලුවා
දළඟා කරඬුව ගෙනියන
උගෙ හීනේ
මළ දා දළ එක්කම
හොරු ගෙනිහිල්ලා

නේත්‍රා නොපෙණුනාට
රාත්‍රියේ ළඟට ඇවිත්
අම්මේ කියල
වතුර ටිකක් ඉල්ලුව අසරණයා

හාමුදුරුවනේ මළ ගමට
එන්න පාර මේකයි
අහන්න කකුලේ වණයක් තිබූ කොලුවා

## 14. බහුතර ගස්

මම ළඳුන්ගේ
තොල් වගේ කිය කියා
නිකමෙක් වගේ
ඔහේ වැනුණා නා දල්ල

පවුලක් ජීවත් කරන්න
හිස කඳින් වෙන්කර
ගෝනියට පැන්නා
කේඩෑරි ගහක තේ දල්ල

ගල් බොරලු වහගෙන
කඩතොළු හංගාන
පා පහරවල් ඉවස ගත්තා
හැමදාම තණ නිල්ල
ඒක අනුකම්පාවට කරුණක් නෙමෙයි
විසි කැත්තකට නොකපන්නට
තණ පතක බෙල්ල

වැල්ලේ ඇස් අරින්නට හදන
කිසිම පැලයකට
අවස්ථාවක් දෙන්න
සූදානම් නෑ රැල්ල
ටිකක් කල් ජීවත් වෙන්න
පොල් ගහක් පවා
මුහුදට පාත් කරගෙන
ඉන්න ඕනා බෙල්ල

## 15. සන්දේශ යවලා බෑ කපුටන්ට ගොඩ එන්න

**කරන්ට් කම්බියක් උඩදි**
**කපුටෙකු කළ කතාවක්**

මොණරු හංසයො ගිරව්
සැළලිහිණි කොවුලෝ සැවුලෝ
මුළු ඉතිහාසයෙම කළේ
කපුටන්ව ඇන්දිල්ල
උන් උස්සගෙන ගිය
කිසි සන්දේශයක තිබුණෙ නෑ
කපුටන්ගේ දුක්ගැනවිල්ල

දඹදෙනි කෝට්ටේ සීතාවක
හැම රාජධානියකම
මුන් ටිකම තමයි රිංගුවේ හැමදාම රජ වාසලට
කපුටු පැටව් හාමතේ අඬද්දී
උන් කළේ රජවරු රැකගන්න
දුවපු එක උපුල්වන් විභීෂණ
සමන් දේවාලවලට

ලැබෙන වරදාන වලට
රාජ වංශයේ කුමාරිකාවකට
මිනිහෙක් හොයන්න
තවත් බිසවකට
බඩට ළමයෙක් ඉල්ලන්න
පරවි මුත්තෙක් සහ සැළලිහිණි අත්තෙක්
දෙයියන්ට කියපු ඉතිහාසයක් තියෙනවා
අපේ නායක කුරුල්ලන්ට

තාම එක කපුටෙකුට බැරිවුණා
වහලක් තියෙන කුඩුවක මැරෙන්න
අඩුගානෙ අපිට අයිතියක් නැද්ද
ඔළු ගෙඩියකට නොවැටෙන්න
නිදහසේ පොළොවට කක්කුස්සි යන්න

## 16. මෝචරිය ඉදිරි පිටදී
## තාත්තා දුන් ඇමතුමක්

පුතේ ඉස්පිරිතාලේ ගෙවුණ මාසෙ පෝයම දෙක තුනක්
උදේ යන්න ගියා අම්මා තනිකරලා උඹෙ පොටෝවක්
ඊයේ පපුවේ නිදිකරෝගෙන හඳේ හාවගේ කමිසයක්
රෑම හීනෙන් පිරිත් කරලා ළඟින් තියලා හාදුවක්

බේබි වාට්ටුව අල්ලාන හිත දිග ඇරියා අවුරුදු තිහක්
සිඟිත්තෙක් පෙඳ යට තියාගෙන නැලෙව්වා මව් කපුටියක්
කූඩුවට ගෙන පියාඹද්දි තුන් දෙනා උන් නුග මුලක්
හොයා වෙහෙසෙනව තාමත් කඳුළු පිරි සුද ආ ඇහැක්

දිය බතක් හරි කටට දැම්මා වත්තේ උඩුඅළු රබර් ගස්
කී දොහක් අපි ගිලන් වූවද ගණන් දන්නව පාරේ බස්
පිටි ටිකක් නෑ කියා ඇනිලා ලිපට දිව්ව වත්තේ කොස්
බෙහෙත් පෙති වල කාසි දුන්නේ දරුවෝ විකුණලා
කෙසෙල් ගස්

ඔතාගෙන රෙද්දකින් අම්මව දන්න අඳුනන බංකුවක්
කොහේවත් තනිකරලා ගියෙ නෑ පුංචි නිලමැසි රංචුවක්
අම්මේ කියලා හිස සිඹිද්දී යකඩ ට්‍රොලියක බම්බුවවක්
වතුසුද්ද මල් තියන් උන්නා මෝචරිය ළඟ වංගුවක්

එන්න දුර බව දන්නවා මම එතෙර වී සමුදුරු හතක්
කන්ද සමනොල වෙතට ගියේ නෑ මුහුදු ඇරලපු කිසි ගඟක්
පුතේ අම්මට ඉල්ල ගත්තා රෝහලේ සොහොනෙන් ඉඩක්
ආපු දවසක ළඟට පලයන් පාර බැලුවොත් නා ගහක්

## 17. මරන්නට මොහොතකට පෙර මීහරකෙක් උගේ පපුවේ පච්ච කොටන මෙන් ඉල්ලා සිටි කවියක්

ඈ මීහරකියක් මැදි වයසේ
කවුද දාල නමක් රත්ති
ගමම දන්නව බඩින් ඉඳගෙන
මහකුඹුර සතියක් මඩවාපු චිත්ති

කැන්ටර් බාගයක් ඇවිත්
කලු රෙදි ඇඳන් ලේ එක්ක බිත්ති
"ර" යන්නට වෙන අකුරක් දාලා
නැගපන් කිව්වාම ගොඩවුණා ඒ ඇත්ති

තට්ටුවේ මී ගොන්නුන්ගේ මිනී තිබුණා
ඉපනැල්ලේ ඒකිට ආලයෙන් දාපු පට්ටි
දරුවෙක් මල කුණක බුරුල්ලට ඇන්නා
කිය කියා අපේ අම්මා හරිම කට්ටි

එක යායේ කරට කර බර වැඩ කළ
සනුහරේ ගාත බෙදාගත්තා බට වට්ටි
ලොරි බාගෙ ඉගිලුනා කෑගැහුවට දැකලා
කොක්කක එල්ලාපු මිනිහගෙ මස් අට්ටි

සියළු සත්වයෝ නිදුක් වේවා කියා
ස්පීකර කටක් අත්තක කියද්දී ඉස්සි
පෝයට සිල්ගත්ත තැබෑරුම ඉදිරියෙන්
මුරපොළත් පහුකළා වැදුම්බර එක්ක වැස්සි

ඊයේ රෑ නගරයේ උදෑසන හලට
රත්තිව නම් කළා මිනීමරු කඩුවක නෙත්ති
බිලන්දෙක්ගේ බාගයක් වදා තිබුණා
හිස කඳින් වෙන් වෙලත් අපේ රත්ති

## 18. වැව් බැඳි රාජ්ජේ ජන කතාවක්.......

අඩියේ වහ ඉතුරු වුණ
මැහි තෙල් බෝතලයක්
පපුව උඩ තියාගත් වැවක්
භාවනායෝගීව වැඩ සිටින
කොකෙකුට හීලට දානේ දුන්නා
මෙතෙක් කල් ආදරෙන් හැදූ
තිත්තයකුගේ මළකඳක්

වැව් බැඳි රාජ්‍යයෙම
වැව් අම්මලට බේරගන්නට බෑ
ඇස් අරින එක නෙළුම් කෙල්ලක්
කොටහළු වෙන්නත් කලියෙන්
පැහැරගෙන යන්නේ
උදෑසන පිහිය ඇදගෙන එන
බීගත්ත චණ්ඩි ඔරුවක්

පලු ගහක් උඩ දැඩු මැස්සකට
බඩක් උස්සගෙන
වැල් ඉණිමඟක බඩගාද්දී
මන්දපෝෂිත සඳක්
වැව් පිටියේ හැමදාම ඇවෙනවා
වකුගඩු වලට විෂ දුන්න
මදු මලක මළගමක්

ගම් වැදී මිනීමරුවෙක් වුණා
පුතා පැහැරගෙන
මිනිහ මරා ආල අරන් ගිය දූකට
පටාචාරා වගේ පිස්සුවෙන්

දිව්ව අඩුකුලේ ඇතින්නක්
ඒකිටත් තියෙන්න ඇති
කොලුව ලොකු මහත්කරලා
දළදාව එක පැයක්
පිටේ තියන අහිංසක හීනයක්

මේ මොකුත් දන්නැතිවද
පෙරහැරේ ගිහින්
දළදා හාමුදුරුවෝ කළේ
විජය රාජා මාලිගාවේ පිළිමයක්
සුදු ඇතා මරා දළ විකුණලා
සමන් දෙයියන් ඉල්ලා සිටි
පූජාවට බෙන්ස් කාරයක්

## 19. කටු පඳුරක් තෘණ අමතයි

මිත්‍රවරුනි

තේ කියන්නේ
ම්ලේච්ඡ ජාතියක්
සමූලඝාතනය කර පැමිණි
ස්වදේශීය පඳුරු

උපක්‍රමිකව පැහැර ගත්තේ
එකගෙයි කෑ රණවරා සහ බෙලිමල්
සොහොයුරෝ පන්නා
ඇඹෙණිය හකුරු

සංක්‍රමණික වතු වලින්
කෝපි එළවා නොදැම්මේ
බෙදා වෙන්කර පාලනයට උගුරු

මිතුරු තුරු කැරැල්ල
අසාර්ථක වූ පසුයි
පහත් නිම්නයේ
හිස ගසා ඇමුවේ දියකඳුරු

පොල්කටු වලින් බැස
ටයි කෝට් ඇඳ
විජාතික පෝසිලෙන් අඩියක
රොඩු වෙන්න
සුලු වාසි වෙනුවෙන්
සහෝදර පඳුරු පාවා දුන්නේ ඉඟුරු

එයින් ඉක්බිතිවයි
නැවත කිසි දිනයක
නිජබිම් වලින් පහළ නොවූවේ
කොන්දක් තියෙන මුගුරු

## 20. ගැටකපන්නා, බිරිඳ සහ ගැට........

කැස්ස වැඩිවුණ නාකි බසයක්
නොන්ඩි ගහනා විටදි අඳුරට
සුද්දෙ ලේසියි වැස්ස හැලුනම
සුද්දියේ හති හලන කොළඹට

පණ කෙන්ද සාතන්ට විසිකර
පැන ගත්තේ දුම්රියෙන් එළියට
ඉතින් ඇරපන් පියාඹන්නට
බූරු ඇඳ උඩ මොණර කුලයට

මේකේ පන්සීයේ පැටියෙක්
යටම අඩියේ බයට හැංගුන
අස්සේ පෙම් කඩදාසි මිටියක්
තාම ඇස්වල කඳුළු බේරෙන

මෙන්න තඹ ඇඳ ගත්ත මුදුවක්
හීනයක රන් කෙන්ද පැටලුන
ප්‍රීති කොපුවක සීත මමියක්
කල්පයක් මග බලා මියැදුන

මේ පොකට්ටුව නව කතාවක්
වෙලුම් දෙක තුනක් ලියවුණ
බෙහෙත් තුණ්ඩුවේ කඳුළු පිහිනව
සීයේ කොළයක් දුක බෙදාගෙන

උපත විපතට මැද්දෙ රූපෙක
මහළු අම්මෙක් තනිව මතුරන
පුතේ වියදම් නේද හරියට
රජේ කැරකොප්පුවට දෙන්න

## 21. අම්මාගේ වල ළඟදී

**ඩෙංගු හැදී මියගිය ගැහැණියක්**
**ආණ්ඩුවේ වියදමින් භූමදාන කරයි - පුවතක්**

මල්ලියේ පස් අතක් දා
වඳිමු දෙන්නම යන්න ඉස්සර
වලෙත් කිරි එරෙනවා අම්මට
මතක් වී අපේ බඩේ කුස්තුර
ඉර හඳත් දන්නවද දන්නෑ
තාත්තෙක් නැති පැලේ විස්තර
අපේ අමම්ව අරන් යද්දි
නිදාගත්තද දෙවියෝ සක්කර

බත් කුරුල්ලන් අඬා කැව්වා
හාල් මිටකට කඳුළු රත්කර
අගුපිලක රෑ කතා කිව්වා
එළා පොළොවට ඇඳපු වස්තර
කිසිම ජාතික සැලැස්මක් නෑ
චුට්ටෝ අම්මා සෙවූ උත්තර
හැමදාම අපි පාට ගෑවේ
මැස්සෝ මදුරුවෝ වහපු චිත්තර

කුණු ඇලක් කරබාන යද්දී
පැල මැදින් මහ නගරෙ මැද්දට
ඩෙංගුවො ඇයි දෂ්ට කෙරුවෙ
පිච්ච මල් මුරකරපු නට්ටට
ලේ ගන්න තොපි කට්ට ගැහුවේ
උණුහුමට ගුලිවෙච්ච තට්ටට
දෙන්නවත් අරගෙනයි ඉගිලුනෙ
කිරිල්ලිය රෝහලේ වත්තට
ඉල්ලීම් ඉල්ලලා බලකර

ආණ්ඩුවේ රෝහලෙ පිරිවර
වැඩවැරූ දින ගෙවි තප්පර
අපේ අම්මා ගියා මොක්පුර
සේලයින් ඩිංගක් පොවන්නට
බටේකින් ආදරේ වක්කර
මාසෙකින් ඉස්කෝලේ ගියේ නෑ
නුඹේ හීනේ පුංචි දොස්තර

## 22. අද පාඩම මයි සෙල්ෆ්
## අන්තිමට අන්තිම පේළියේ අන්තිමය......

ටීචර්, අම්මයි මායි ඉන්නේ
කැලෑ ගාලක ආත්තා
හැටේ වත්තෙන් එළව දැම්මා
ග්‍රාමසේවක බාප්පා

ගමේ කොල්ලන් කියල දුවනව
මාළු ලාලගේ කෝට්ටා
අපේ අම්මත් කිව්වේ නෑ මට
හඳේ හාවගේ තාත්තා

ගෙවල් ගානේ පියාඹද්දි
කටෙන් එල්ලන් බෙලෙක්කා
මාව අම්මගේ බඩෙන් තිබ්බලු
රෝස අකුලෙදි කාක්කා

පැලට ලොකු නම වැඩපු දවසට
හරිම විහිලුයි ඇබිත්තා
අම්ම සසරෙන් එතෙර වෙනවලු
දානේ දුන්නම ආප්පා

## 23. අම්මේ මම අන්තිම ඉන්ටව් එකත් ෆේල්.....

රාස්සිගේ අච්චරල්ල රාස්සිව පිච්චෙන්න
වී පැදුර බොල්වුණා මහ රැක අලි පැන්න
අඬ අඬා කියද්දි පරවියනි නෑ කන්න
මං ගියා කිඩාරම් මලේ පෙති විකුණන්න

දියවෙච්ච උපාධිය රුපියලේ උරයට
විසිකළා දුවද්දි කළු ගඟේ සුළියට
ඇලවෙලා ලංගමේ ගාටද්දි කොළඹට
ළංවෙලා ඉන්ටව් කොළණියේ බැල්ලිට

දිලිහෙද්දි කාමරේ බඹරුන්ගේ ඇස් රතට
ගලවද්දි ගල්වුණා මල් ගවුම පපුව යට
මකරන්ද කෝ ඇහුවා තවරන්න මකරුන්ට
බිංදුවක් මට දුන්නෙ මී හරක් හමකට

වැඩි ලකුණු රතු හාට් ටැටූ කළ පපුවකට
තනපටක් තිබුණෙ නෑ වේලිච්ච දර ගහට
විසි දහයි මුල් රැට කුළුඳුලේම නෙළුමකට
මං කිව්වා අප්පච්චි නැගපු බව කරඬුවට

මච් ගහට බෑ ඇත්ත රුක් මලට පෙති දෙන්න
කරටියම විද්දේ ඇයි කුරුමිණියා බඩ කන්න
ශ්‍රීකයෙක් කියද්දි පණපොවපු වැළහින්න
මං අම්මේ ඉල්ලුවා එක රැක නිදියන්න

අවසානෙ අරගද්දි වස්තරේ අත් දෙකට
සුදුසුකම් නෑ කිව්වා බුදු අම්මේ ලොක්කිට

## 24. ඕස්ට්‍රේලියානු වෙරළට ගොඩ ගැසූ ලිහිණියෙක්......

මීගමුවෙ කලපුවත් දන්නෑ
බෝට්ටුව එන බව එදා
එක ඔරුවෙ කරදියේ කිමිදුණ
ලිහිණියන් උන්නා නිදා

දුවේ දහ මාසෙටත් කිට්ටුයි
කිවූ පසු කෙකණිය හඬා
වල්ලමක් දෙන්නව වඩාගෙන
දිව්ව මුහුදට අඬ අඬා

තට්ටුවක මාලුවො උන්නා
අට්ටි දෙකකට අහුරලා
මාලනි මල් මාලිගාවක්
සිඞ්නි අහසේ ඉදිකළා

ගෙවුණු පසු දින දාසයක්
එකෙක් දෙන්නෙක් පාවෙලා
මුහුද මහ රෑ රෙද්ද උස්සලා
පුරුෂ ලිංගය දික්කළා

වැරෙන් රළ ගෙඩි අරන් කළ ගෙඩි
ගහද්දි රෙදි ගලවලා
සරම මිරිකලා ලුණු වතුර පෙව්වා
මාලනි ඇසි අරියි කියලා

හුරුළු පැටියෙක් හුස්ම කඳුලක්
හොයද්දි කුස කලතලා
හඬෙන් පළුවක් ගිල්ල කළුවක්
තිඹිරි ගේ සුන්බුන් කළා

වරෙව් එළියට කියා සුළඟක්
රැවල් වැරහැලි බය කළා
වරල් ගැහෙනා සාල අම්මෙක්
එකෙක් දියඹට විසිකළා

මිනී මෝරෙක් පැටිය පෙන්නුව
කියත් දෙකකින් බඩ පලා
මාලනී බුදු පුතේ කිව්වා
මරියානා ආගාදෙට ගියා

## 25. නංගී එල්ලුන ගස යටදී

නුගේගොඩ හංදියෙන් ඉගිලුණ
බස් එකක් ඇහුලුවද පොඩ්ඩිව
බෝ ගහත් කරබාන කිව්වා
මේ මෙතන ඒ ලෙවල් පොත් ටික

පස්සෙ අසුනෙ යකඩ පොල්ලට
තුරුළු වී ගිය හැට්ට කට්ටට
මවා පෑවම හින්දි කෙප්පර
ආදරෙන් උඹ වුණා ගැබ්බර

මල් වත්තෙ පිටු දෙකක් පත්තර
අහුල ගද්දි උඹේ වස්තර
මහ ගහක් යට ඇඳපු චිත්තර
පස්සෙ කාලෙක ප්‍රශ්න පත්තර

හොර වෙදෙක් අතදාලා බින්දම
බඩේ හැංගුව කපුටු බිත්තර
ඔරලෝසු කටු අරන් දිව්වා
මහ මෙරක් බර කඳුළු තප්පර

සාරි පොටකින් වහල උත්තර
ඇහැල අත්තක පාර අද්දර
ඇහුණා කියනව එකෙක් ඇටවර
සතා එල්ලිල විස්සෙ අක්කර

## 26. වල්ලිඅම්මාගෙ මරණය

වල්ලි අම්මා කෝවිලේ
මල් මාල විකුණපු පිලේ
වල්ලි අම්මා වැටිල හිටියා
මැණික් ගඟ ළඟ තොටුපළේ

කන්ද කුමරුනි
ඇයි නොදුන්නේ
අත් දෙකට වේලායුදේ

රත් පියුම පරවුණ වෙලේ
දිය කැපු තැන කරුවලේ
සත් පියුම් හඬ හඬා හිටියා
හස්තියෙක් නැති අතු පැලේ

කන්ද කුමරුනි
ඇයි නොතිබ්බේ
ඉතුරු පලතුරු කිරි තොලේ

අසිපතක් ගත් දේවතාවෙක්
රන් වැටෙන් පැන්නා කැලේ
කතරගම අමු සොහොන් පිටියේ
වල්ලි අම්මා ගිනි මැලේ

කන්ද කුමරුනි
ඇයි නොදැම්මේ
මාලයක් වද මල් ගෙලේ

## 27. නෙළුම්ය

පිහිය තියලා වැවේ බෙල්ලට
උදුර ගත්තා නෙළුම් කැකුලිය
අරන් යද්දි හොරුන් නුවරට
හුඟක් ඇඬුනා පොළොන්නරුවට

හුල්ලද්දී ගහක කෙකිණිය
රැල්ල දිව්වා ළඟම ඉවුරට
සුවඳ තිබුණා මලක කෙකටිය
කඩලා තිබුණා නටුවෙ තුනටිය

අතින් ඉරලා වටේ පෙති ටික
සුළඟ වැහුවා පොහොට්ටුවෙ කට
මලක් කරලා සිලිං අතකට
කඳුළු එතුවා පඩංගුවකට

පයින් පාගා වැටුණු අරලිය
අඳුර ඉඳගෙන නුවර ගස් යට
නෙළුම දුන්නා දේව රූපෙට
පඬුරු ගැනලා බෝ ගහක් යට

මලක් වැටුණා පහල මළුවට
දැවිල තිබුණා හඳුන් හුලකට
භාර දෙද්දි පහන් කණුවට
කඳුළු ආවා කොළඹ අහසට

## 28. කුසුමක්දෝ ඔබ

නිරුවත් දෑසින්
නිරුවත සොයනා
නිරුවත් මිනිසුන් සරණා කුටියක
නිරුවත් කර සිත
සෙනෙහස සොයනා
කිරිල්ලියක් මට මුණගැහුණා

සරණක් නැතිවුණ
ජීවන සයුරක
ඔරුවක්දෝ ඔබ තොටියෙකු හැරගිය
දියබත් ඔරුවෙහි දියඹෙහි පාවෙන
කුසුමක්දෝ මම ඇසුවා

පවුලක් සුරකින
ජීවිතයකට බර
උහුලා යහනක් ඉහිලුම් නැති සඳ
නිරුවත් කර ළැම
කඳුළක් කොට ළය
සැතපෙන්නේ කෙලෙසකදැයි ඇය ඇසුවා

## 29. වෙස්සන්තර රජෙක් වෙන්න පැතුවේ නැති අප්පච්චි........

විහාර ගෙයි රන් පිළිමෙන්
වරම් අරන් අප්පච්චි
මකර තොරණේ මකර කටේ
නෙළුම් ඇඹුව අප්පච්චි

වෙස්සන්තර රජෙක් වෙන්න
පැතුවේ නැති අප්පච්චි
සඳකඩපහණ උඩ තුනටිය
දන් දුන්නා අප්පච්චි

ගලේ ලිය වැලට
ලේ සායම් පෙවුණා
වැලේ හංසයෝ
අඳුරේ පැන දිව්වා

පැලේ සඳ වතුර රෑ කළුවර බිව්වා
ගලේ විහාරෙට මාවත් දන් දුන්නා

වනේ උලලේනි
දුව දුව එල හෙව්වා
පිලේ දඬු මැස්ස
ලෙඩ ඇඳ වී උන්නා

කැලේ පාරකින් පූජකයා පැන්නා
අපේ අප්පච්චි අම්මත් දන් දුන්නා

## 30. මුහුදෙන් ගොඩ දැමූ කිඳුරියක්........

**පෙම්වතාගෙ රැවටීමට හසු වී සමූහයක්**
**කෙලසනු ලැබූ තරුණියක් මුහුදට පනී.**
**පසුව ඇයව මිනිසුන් ගොඩගනු ලබයි - පුවතක්**

ඇයි උඹලා ගොඩ දැම්මේ ඉතුරු වුණ පණ කඳුල
සාක්කිය කියනවා අන්න අර කටු අකුල
අන්තිමට මගෙ ඇඳුම අම්මා දුන් සුර කබල
මාරියාවට බයේ දුවන්නද මේ වෙරළ

බස් එකෙන් ඇහුලුවෙ ඊයෙ මං ආදරය
දෙහිවලින් බහිද්දි නිදාගෙන සාගරය
ගල්කිස්සෙ ගලක් උඩ වැටුණාම ජීවිතය
රාත්‍රිය ගෙනාවා ඒ නපුරු මාරුතය

පොල් පැලේ දණ ගැහුවා ගැහුවාම වැහිකළුව
අප්පච්චි වගෙ කියල මං හිතුවේ ඒ පපුව
කුණාටුව ගොරවද්දි ගල්වුණා හඳ පලුව
පෝලිමක් මාපිල්ලු රැල් කළා මගෙ සළුව

රත්තරන් කිව්වහම මං හිතුවෙ බෝසත්ය
තිත්තපල් රැ පිච්චුවේ මංමුලා තරුවක්ය
හෙණ ගහලා ගල් පොත්තෙ ඉතුරු වුණෙ පැල්මක්ය
සක්කරයා පණ දුන්නෙ කිඳුරෙකුට විතරක්ය

සිහිය කට මට එද්දි කලු ගලෙන් කඳුලක්ය
බයවෙලා මහ පොළොවෙ මගෙම ලේ කැටියක්ය
වෙහෙර මහ දේවියත් පිරිමි දුන් බිල්ලක්ය
සඳකිඳුරෝ විසි කරපු මං කිඳුරු කෙල්ලක්ය

## 31. වවුලාගේ මරණය

බිරින්දැගෙ දොළ දුකට
අඹයක් හොරෙන් කැඩුව වවුලා
විදුලි රැහැනකට පුළුවන්ද
එල්ලන්න රෑ එකට ගහලා
වධකාගාරයක් වගේ
අන්තිම පණ බිංදුවත් හොයලා
පුච්චන්න පුළුවන්ද
පවුලක් ජීවත් කරපු ඒ මා වවුලා

දුප්පතෙක් හාල් තුනපහේ
හොරකන් කරයි කියලා
ඔත්තු කරුවෙක් වගේ ඉන්න
විදුලි පහනක් දැකලා
මං නම් හිතන්නෑ මැස්සෙක් වත්
හිතනවද කියලා
රෑකට උන්ගෙම උන්
කීදාහක් මැරුම් කනවද කියලා

සාහසික වධ දීලා හිමිදිරියේ
අහිංසකයෙක් බිම ආලා
විදුලි රැහැනක් අර බෝ කරටියේ
රහත් වෙයි කියලා
ට්‍රාන්ස්ෆෝමරයකට පුළුවන්ද
ඒ මිනියවත් නොබලා
නිදොස් කොට නිදහස් කරන්න
හිතවතෙක් කියලා

බිම වැටුණ වවුලෙක්ගෙ
පිළිස්සුන ඇටකටු දැකලා
බල්ලෙකුට කෑ හැකිද
මුත්‍රා වලින් ආචාර කරලා
නැගල යන බටයෙකු අතේ
ගිනිකඳක් තිබුණා කියලා
රෝදෙකට හැකිද ඇට ටික තලන්න
මහ පාරේ තියලා

## 32. පතිනි සළුව

සොඳුරියෙ නුඹමයි පෙරුම්පුරා
දවසක් අඹ මලකින් බැස්සේ
අඳුන් ගිරේ පැල තෙමුණට
අකාල වරුසාවේ

මට කියපන් කොහොමද
පතිනි සළුව තඹ කාසි වලට වික්කේ

උඹ ප්‍රමිලා දේවිය නම් කම් නැත
ඈ එක බිසවක් විතරයි
වාසල් දොර අස්සේ

මට දරාගන්න බැරි
නෑ අන්තප්පුරයක් තිබුණේ
මගෙ මේ දඬු මැස්සේ

උඩ දෙවියො මැවූ කුණාටුවක්
මේ නියන් ගමම අද පිස්සේ
උඹ දන්නවාද අපි වැලපෙද්දී
තව කඳුළු දෙන්න
ඒ දෙවිවරුමයි
මහ පොළොවට බැස්සේ

## 33. කෑල මලක්

කඳුළු නැතිව උලලේනිය
හූල්ලනවා හන්දියේ
හිතක් නැතිව මහසෝනා
ඉගිලුනා ද වංගුවේ

කහ ඉර උඩ කෑල මලක
මාරයාගේ බංකුවේ
බෝගහ යට ගල් පිළිමය
ගල් වෙලා ද නංගියේ

හීන ගොඩක් හිත ගෑවුණ
උඹ ඉපදුණු සංදියේ
උලලේනිය උඹ එනතුරු
තාමත් ඇති හන්දියේ

බඩට හොරෙන් ගල්කුරෙන්
අකුරු ඇඹුව නංගියේ
පොත් අහුරක් තනි රකිනවා
උඹේ පාමුල හන්දියේ

පාන නිවා මෙරු රෑනට
පාර කිව්ව නංගියේ
පෑව හිනා මට හීනෙක
අමුණ දියන් පැංචියේ

රෑන ගිරව් උඹ එනතුරු
මාන බැළුව හන්දියේ
සුදු කොඩි වැල හත්දොහකින්
මියැදෙනවා නංගියේ

## 34. දුවේ දැන් ගෙදර යමන්.....

**නිමිත්ත-හිතුවක්කාරකමට කසාදයක් කරගත් දුවෙකු දික්කසාදය අවසානයේ උසාවියේදී තාත්තට වැඳ සමාව ගනී.**

දුවේ උණුහපුළු අම්මට උගෙ දරුවා
නොකියා ගියත් තුත්තිරි ගහෙනුත් ඇහුවා
අත නැති බෝනික්කි ගෙයි මුල්ලේ ඇඬුවා
උඹ නිදියපු පැදුර ඒකිගෙ දුක වැහුවා

උසාවිය බය කරලා උඹෙ කඳුළුත් බිව්වා
නීතිය කියල කොහොමද ඇහුවේ එව්වා
වන්දිය නැතත් බොට මහ පාරක් හෙව්වා
චුට්ටියෙ කළු පූසා සුදු පූසිව ලෙව්වා

ඇස්ගෙඩි පාදන්න මං ගස්වල දිව්වා
අම්මා කිරි ගහෙන් කිරි කඳුලක් ඇහුවා
කළුවර රෑක වැස්සක් අපි ගැන හෙව්වා
දෙල්කොළ දෙකක් පොල් අතු කටකට පෙව්වා

තුනපහ මිටක් අම්මා කඩයෙන් දෙව්වා
මාපිල් වගේ ණය වැල පස්සෙන් රැව්වා
තාමත් පොඩියි උඹ උහුලන්නට මෙව්වා
ඔසරිය කොට කරලා අම්මා ණය ගෙව්වා

සමනල ගලත් සමනලු පොළොවේ ගැහුවා
ඒ බව දැන දැනත් උඹ ගල උඩ වැහුවා

## 35. මැයි විරු රැස්වීමට පසු

මැයි විරු සමරු රැස්වීමක ගිහින් පණ
කොඩියක් පාර අහනවා මංමුලා වුණ
විරුවෙක් තනිවෙලා
පවුරක ගසා ඇණ
රතු මැයි මල් දුවයි
පාරේ තැනින් තැන

බැනරයකින් ගස් දෙබලක වහන් වුණ
මැයි ගහ ටිකක් අහගත්තා
ලෙනින් ගැන
පිට්ටනියක් පයට පෑගුන කඳුළු බොන
බත් කොල අතින් පිරිමදිනවා
රිදෙන තැන

හිස් ගල් බාගයක්
කුණු කාණුවේ යන
ගඟටත් හෙට පොවයි
බිඳුවක් ඉතුරු වුණ
අඳුරක් ඇවිත් අතකින්
මහ පොළොව කැන
විරුවෙක් වලදායි
දිනකට දුන්න පණ

## 36. වී

කමත උඩ ගැඹුරු මල්ලක
අත් දෙකට දීලා
ආදරෙන් ලේ කිරි කර පෙවූ වී කෙල්ල
දුවේ මම තව දවස් කීයද
ජීවත් වෙන්නේ
කියා කඳුළු පිස්සා
ගහක් යට ඉපනැල්ල

වක්කඩෙන් නියරට
ඇවිත් උන්නා සමුදෙන්න
එක කුඹුරේ එකට මඩ නැව
දියහබුරු ගොල්ල
බිම බලාගෙන දරු දුක
පපුව යට හංගගත්තා
නියඟෙක පවා කන්න දුන් වැව් තාවුල්ල

පාරම බලා ඉඳ කොළ හැලි කෙට්ටු වූවා
තැල්ලක් හදන්නට
මල් පියලි ඇමුණුව නිල්ල
මාසෙකට පසු ආරංචි වූවා අච්චට පන්නා
නගරයේ මෝලක කොටා
ඇඹරු බව වී කෙල්ල

## 37. පශ්චාත් අවුරුදු සිද්ධි........

සැළලිහිණියා
සති දෙකකට කලින්
බතික් අන්දවා ගෙනත් ඇරලූ
දවස තිස්සෙම අතෝරක් නැතිව
රැප් සංගීතයට ජන ගී ගැයූ
ප්ලාස්ටික් කොවුලු කෙවිලියෝ
හනි හනික සාලයෙන් ඉගිල යන කාලයකි

ඉතින් දැන් නොගයන්
රන්වලයාණනි
"මේ අවුරුදු කාලේ
හිනාවෙයන් රාලේ" වැනි වැකි
මේ දැන් ලබන්නේ
කණකර පවා උගස්කර
ගත්ත රෙද්දෙන් හැට්ටෙන්
පිහදාන කාලයයි ඉකි

නළඟනන් ඔංචිලි පදිද්දී
වාරම් ගැයූ බැද්දගේ
නවසීලන්තයේ දෙනුන් මැද්දේ
බැද්දේ නොපෙනී යයි මැකී
අලුත් පරපුරේ ගැහැණියක් ගෑස් ළිප උඩදි
කොණ්ඩය බූ ගෑ කැවුමක්
ගම වටේ රවුමක් ගොස්
ආයෙමත් ගෙදර ඇවිදින් ඉදී

"දොන්න බබක්කට කන්න දෙයක් නැත
පෙට්ටගමක් උඩ තුට්ටු දෙකක් නැත" කියා

රබානට නෙමෙයි
පිඟානට තට්ටු කරන්
කාලයක් ඉදිරියට එන්නේ සකි
තුට්ටු දෙක ගත්ත උන්
අවුරුදු නැකැත් සැමරූ හැටි
සාලයේ ඉඳ ජාතික ආලයෙන්
පොකුරට නැරඹුව ජාතියක් අපි
යන එන මං නැතිව
දුරකථන හදවතක අතරමං වී
සාරා සංඛෙයිය කල්ප ලක්ෂයක්
සුබ පැතුම් වැකි

## 38. අපි දෙන්නා සහ බැද්ද

මේ මෙතන තියෙන්නේ
හීන් බෝවිටිය මල් තලාගෙන
අපි දෙන්නා වාඩිවූ බැද්ද
තාමත් ඇහෙනවද ඔයාට
ඒ පුංචි දියපාර බලා ඉඳ
ගලාගිය සද්ද

මට තාම මතකයි
දේදුන්න මැද්දෙන් ඇදල
මාව වාඩිකරල
අහසේ හරි මැදට
ඒ මොහොත ඔයා විද්ද

ඒක හරි ලස්සන තප්පර කිහිපයක්
මං හඳ වෙලා තරු වැලක ඔංචිලි පැද්ද
මට මතකයි ඔයා ඇහුවා
එක හාවෙක් ඇද්ද

මේ මෑත දවසක
අපි ඇවිද ගිය අඩිපාර
මදුවැල් ඇද දමා
වැහුවට පස්සේ මේ බැද්ද

ඇයි මේ මගෙන් අහන්නේ
මෙන්න මේ පඳුරු කිරි ඉද්ද
ඔයා මේ ලෝකේ කොහේ ඇද්ද
ඇවිත් කියල යනවද
ඔය කියපු දවසේ
ඔයාට මං වෙන් කරපු බව
මගෙ පපුවෙ හරි මැද්ද

## 39. උසාවිය පොලිසිය සහ මුහුද ළඟ රෑ ගහක කාක ජනපදයක කපුටෙක් අවදියෙන්.......

කොලනියේ කපුටන්ට කළුවර හොඳට පුරුදුය
ඒත් මේ නම් එන්නේ අමු තිත්ත කළුවරය
කරන්ට් කම්බිය කූඩුවට ගෑවෙයිද බයය
මේ සුළඟ නම් සඳට අතවර කරන එක නියතය

උසාවි මිදුලෙහි දෙවඟන ලා දුහුල් ඇඳුමෙන්ය
බිලියන තන පටේ ලිහන කොට මිලියන ඇඟ උඩය
කඩුව තරාදිය ගරාදිය උඩ තියා පිරිමදියි නාබිය
කපුටනේ ඇහෙනවද ඇගෙ සරාගික කෙඳිරිය

ඉදිරිපස පොලිසිය වැහැරී කියයි සිරමැදිරිය
මේ දැන් රුපියලක් අණ්ඩකෝෂයෙන් එල්ලිය
ගිනියම් යකඩයක් යටි පතුල්වල ගැල්විය
ඔය කෙහෙල් කැන තියපු තැන ගයන සංධ්වනිය

මේ දැන් හූ චලනයෙන් නොගැඹුරු මුහුද චංචලය
පේන විදිහට ඈත දියඹ මතුපිටින් හරිම සංවරය
සුනාමි එන්න නම් පසුපසට යා යුතුය සාගරය
මේ විරාමය උදම් රළ හා සාකච්ඡාවක මාරුතය

## 40. කෙල්ලක් කෝච්චියට බෙල්ල තියද්දි කපුටියක් කිවු කවියක්........

නංගියේ උඹට කවුරුවත් කෙරුවද බොරුවක්
රැක තරුවක් ඉරන් කෑවද ආත්මෙන් උඹේ ඉරුවක්
කියාපන් හදවතේ ඇණුනද ආදරේ ඊයම් බරුවක්
පරක්කුයි කිව්වද මූණටම අන්නාසි තරුවක්

අම්මෙක් තමයි බන් ආදරේ පැටියෙකුට මැරුවත්
අනිත් උන් පොවන්නේ ආදරේ ඇල්වතුර සරුවත්
කෙල්ලක කියන්නේ තොටියන්ට යන එන ඔරුවක්
කොයි එකත් බහිනවා හබල් ගහලා වරුවක්

මගෙ හීනේ හිටියෙත් රත්තරන් පෙඳ ඇති ගිරවෙක්
කජ්ජටත් කලියෙන් ඌ මල කෑව ඉතුරු දැන් මට නටුවක්
හිනාවෙන්නට තමා උන්නේ අසල්වාසි කොරවක්
අන්තිමට උරුම මට පාරේ කොට්ටන් ගහක කරුවක්

අම්මා තාමත් මතුරනවා ඇති පාර බල බල පිරිතක්
ඉල්ලුවොත් තාත්තා ගෙනත් දෙයි අතට සඳ වතුරත්
නංගියේ නරියෙක් නිදියගත් විට පපුව උඩ වරුවක්
අම්මෙක් තාත්තෙක් උඹට වෙනවද මෙරුවෙක්

මගේ මිනිහත් ඇඳට එන්ට තමයි වෙස්සන්තර
කපුටො මදිවට කොවුලො තියනව බඩ යටින් බිත්තර
හඳට හාවෙක් බලෙන් දුන්නත් වටිනවා ජීවිතේ තප්පර
වහල නැති මේ කපුටු කූඩුවේ මටත් නෑ උත්තර

කෝච්චියකට බෙල්ල තිබ්බට ගෙදර දුවලා යනව ගින්දර
පහුවදා බත් ඔතලා කනවා උඹේ මළකඳ ගහපු පත්තර
හුඟක් උන් ලෙවකාලා බැලුවට සීගිරියේ කෙල්ලන්ගේ චිත්තර
කීදෙනෙක් කෝ කොහෙද ඇහුවද කළුගලෙන් උන් ඇඳපු වස්තර

## 41. පනික්කියාගේ දුක්ගැනවිල්ල

වැඳ අවසර විපත්තියක්
ගුරුන්නාන්සේ මාමේ
මහසම්මත රජුන් නෙමේ
පනික්කියා පහල ගමේ

අසුබ කාලයක් ළමයෝ
කොල වරලා කෝං ගහේ
පඬුරු මුකුත් ඕනෙම නෑ
කියාපන්කෝ කතන්දරේ

වඞ්ග නුවර රජ වාසලේ
බැල මෙහෙවර කරන වෙලේ
තනියෙන්මයි පැලේ උන්නේ
මැණික්පාල බිසව මගේ

කපුටු නාම්බෙක් පින්නේ
වැක්කෙරුවා මගේ කනේ
වසවර්තිය වැහිල නේද
ඔළුගෙඩියට ආලා විනේ

පැන් දුන්නොත් යනව කිව්ව
මාමේ අනෝතත්ත විලේ
නාගවල්ලි ගෙන්න ගන්න
නැයෝ නැනේ නාග ලොවේ

කුරුළු ජෝඩුවක් වගේ
බොල උන්නේ පනට පනේ
ගම් හතේම බෝ වෙනවා
කුඩු කඩන යක්ෂ ලෙඩේ

## 42. ආදරය කියන්නේ.......

හිස් අතින් යන්න කිව්වට
එහෙම ගියේ
බුදු කෙනෙක් පමණයි නේනා
ආදරය කියන්නේ
සුළඟක් නේද
හමා යන්නට නොමැති සීමා

සයුර හමු වූ දිනේ අතැර යයි
ගොඩබිමක් සියලු ගංගා
මුවදොරක ගිලෙන
තප්පරේකයි කියන්නේ
කල්පයක් ලියන්නට තේමා

කෙසේ නම් අඳින්නද
උණු කඳුලින් සදාකාලික රේඛා
දියඹකට යන්න දෙන
ආපසු එන්න දෙන වෙරළකින්
ඔබ ආදරය ඉගෙන ගන්නට ඕනා

## 43. රේල්පාර ළඟ ටැප් එක

ශුක්‍රාණු වරන්නට
අරඅදින ලිංගයක් සේ
ඉඳහිට ප්‍රාණවත් වෙන
ටැප් අතක් අහිමි
එස්ලෝන් බටයක්
මුත්‍රා කරයි
තරමක් උණුවෙන්
උඩුබැලි වූ තොල් පැලුණු
ඇලුමිනියම් කලයක කටට

ටී ෂර්ට් මල්ලක
කඩිමුඩියෙ හැංගු
පියයුරෝ තරගයට දුවද්දි
ගැහැනියක උකුලෙහි
ගැබ් ගත් කලයකි
එල්ලේ අතක
තනියෙන් සිට ගත නොහැකි
අඩිය කොර
යාචක පනිට්ටුවක්

ජනතා සන්තක බැරලයෝ
තෙමද්දි ගැහැණුන්
රුපියලක ටකරන් සිදුරකින් බලා
ස්වයංවින්දනය කරයි
කොල්ලෙකු අධිවේගයෙන්
අම්මා වැල්ලේ
මාලු කූරියෙකු හොරකමට
කුරුමානම් අල්ලන අතර

දුම්රිය මහල්ලාට මඳ විරාමයක්
පෙම්වතෙකුගේ කඳ හිසින් වෙන්කර
මගියෙක් මොර දෙයි
"මුන්ට මැරෙන්න වෙන විදියක් නැද්ද
අදත් රතු ඉර"
ටැප් එක අසල පෙට්ටි වල නිදා සිටි මහතුන්
වහා නැගිට එබිකම් කරයි
මරණය අමතක කර
මොහොතක් හිතින් රමණය කරයි
පිටත් වීමට පෙර

එකෙකු බාල්දියක් ගෙන පැමිණේ
කොල්ලෙකු කෑ ගසයි
"ගුණේ අයියේ වත්සලා බඩින් කක්කුස්සියේ"
ඔහු කෝච්චිය යටින් රිංගා
මුහුදු වෙරළේ
සරම ගලවා ගුලි කර වාඩි වේ

කෝච්චියේ මගියෙකු බෙරිහන් දේ
"නොදකින් කැස්බෑවා
මේකේ ගෑණු යනවා"

පොඩි එකෙකු මතු වී
උපන් ඇඳුමෙන්
ඇසිල්ලේ වතුර බටයෙන් දිය බී
වැසිකිළියෙන් ගලා එන
දුර්ගන්ධ මඩ වලේ
කොලයක් පා කර විනෝද වී
අර්ධ කවාකාර හැඩයකට
මුත්‍රා කරයි

දුම්රියේ මගියෙකු කෑගසයි
"නිරුවත් වානරයා"

## 44. ඔබ නිසා මම ද කතුවරියක් වුණෙමි

පෙරවදන පමණක් ලියා
නැවතීමේ තිත තියා
පෙරදිනක ඔබ ගියා
කතුවරයාණනේ

ඔබේ කටු සටහනක්
දස මසක් කුස දරා
විලිරුදා ඉවසලා
ළපටියෙකු බිහි කළා
කියන්නට ඇත්නම්
මමත් කතුවරියක් කියා

නිමි දිනක් නොදන්නා
මේ මහා කතාවේ
වෙළුමෙන් වෙළුම
කඳුලෙන් ලියද්දි
රසික හිතවතුන්
නින්දා සොයමින්
පිටකවරේ ඇන්දා

## 45. මගෙ දුවේ

දෙවි කෙනෙක් නෙවේ
හොඳ මනුස්සයෙක්
හොයපන් දුවේ
හෙට රාස්සයෙක්
උඹ අරන් ගියොත්
මට වාවගන්න බෑ දුවේ

රජ කුලේ වුණත්
ඇත් පුත්තු පිටේ
රන් කරඬුව වැඩම කළේ
මව් කුලේ වුණත්
උන් හදපු ඇතින්නියෝ
දුක්වින්දා ගස් යට කැලේ

කටු ගහක් වුණත්
පෙති දුන්න මලක්
පිපුණාම දෙවියන්ගේ පැලේ
මොන දෙවියෝ වුණත්
මල් සුවඳ අරන්
බිම දාපු එකයි කළේ

## 46. මනමේ කෝලම

වංකගිරි රඟහලේ
මනමේ කෝලමෙන්
බැසගියා මනමේ කුමරා
අතරමං වී හිමේ
කොලනියේ වැද්දෙකුට
මං කඩුව දුන්නා

කොන්තගං තොටේ
කොඳ මලක කෙමියේ
ඈතෙක් බර ආදරේ
පිටාරය හඳ එළියෙ ගැලුවා
ඒත් හිමිදිරි උදේ
කනකරත් පාලු වී තිබුණා

එතෙර වෙන්නට කලින්
වැදි රජුන් කාක දූපතට
පතිනි සළු සල්පිලේ වික්කා
ගෙදර එන්නට අම්මේ
ඇඳිවතත් ගලවලා
මං ඔරු බඳේ තිබ්බා

## 47. මුහුදු හතකින් පැන්නෙ අම්මා......

නේරංජනාවෙන් නෙමේ නංගියෙ
මුහුදු හතකින් පැන්නෙ අම්මා
හිටියෙ නෑ කන්ථකත් චන්නත්
තොටුපලට ගියෙ පයින් අම්මා

බිම්බරක් මාරයන් ඉල්ලුව
හිස කඳින් වෙන් කරලා දුන්නා
එදත් වේලට මල්ලි රාහුල
අම්මා එවු තඹ කාසි ගැන්නා

කැපූ හිස අත් දෙකට අරගෙන
වැලි මිටක් දණ ගහලා වැන්දා
ඇහැක් මුල පණ යද්දි කඳුළක
අහන්නැති කෝ පැටව් දෙන්නා

කිසිම දවසක බුදුන් වෙන්නට
නැතිලු විවරණ ලැබුවෙ අම්මා

## 48. කිරිකැටි දූට වැදුම් ගෙදරදී අම්මා කිවු කවි

එදා මූසල අඳුරු මණ්ඩියේ
දුවේ බස් එක ආලා පැන්නා
රෑ බඳුල්ලෙක් පුලුටු කරලා
පහන් කණුවක් පහන් නිව්වා

පාර අද්දර මහලු නුගයක්
අඳුරු රෙද්දක කිරා වැටුණා
නිදාගෙන උන් පිළිම හිසකින්
වවුල් රෑනක් බණක් ඇහුවා

නපුරු හොල්මන් අඳුර අහුලල
පාර මැද්දෙ පොළොවෙ ගැහුවා
මලක මල් පෙති ඉරා ගන්නට
බඹරු රෑනක් ගොදුරු හෙව්වා

රහස් පෙති ටික බේර ගන්නට
දාස් පෙති මල හුඟක් දිව්වා
මුනින් වැටුණම කානු පල්ලට
දහස් වර දණ ගහලා වැන්දා

වැහි වලාවක් වදා ගන්නට
අහස කන්දක බඩින් උන්නා
දුවේ මං කෑ ගහපු සද්දෙට
කන්ද මුදුනෙන් හඳත් පැන්නා

රැයක් කෙලවර ගහක් පාමුල
දුවේ උඹ මගෙ බඩට දුන්නා
නැතත් පියවරු සිහිය එද්දී
රැයට අප්පලා හුඟක් උන්නා

පින්නෙ හිමිදිරි බලු මහල්ලෙක්
ඇහැක් පාදල වතුර පෙව්වා
දුවේ දස මාසයක් තිස්සෙ
ගම කතන්දර පොතක් ලිව්වා
පාලු කුටියක කඳුළු නූලෙන්
මමත් මැහුවා පුංචි කොට්ටා
හැඬුම් ඇහිලද පයින් ගහලා
දුවේ උඹ මට කිව්වෙ අම්මා

පිහිය පෙකණිය කපපු පිම්මේ
පපුව රිදිලා කිරිත් විද්දා
දුවේ මං දුක්වුණා හරියට
උඹත් ලස්සන මලක් හන්දා

## 49. කළුකරේ කළු අතේ නැති කවියක්

ඔව්, මහත්තුරුනි නුඹලාට අනුව අපි හැඩි දෙමළු
එපාද ඉර පායන්න අහසෙ බණ්ඩාරවෙල බඳුළු
අකුල් ගානේ හැම දෙමළියෙකුටම දුන්නා කැකුළු
මැස්සොද අපි සිංහ කූඩුවල බැඳුණු ඇල්වල මකුළු

දළු ගෝනිවල කළුළු බර දන්නෙ මෙන්න මේ උකුළු
අලුගෝසුවනි පැහැරගත් එළුවන් කෝ අහනවා වන වදුලු
දුටුගැමුණුගේ සිට එකම විසඳුම අළු කරන එකද දෙමළු
කසිප්පු බීපු තේ ගස් වලට අද ඉතුරු දිරාපු ඇට මිදුළු

දළු කඩන රූපයක් එල්ලාන හැඩ බලද්දී තල සඳළු
පඩි පෙළක් පැටව් එක ගුලියක කඩමාළු වල පැදුරු
එලිබහින අතරතුර කිචිකවනවා පස්ස තුත්තිරි පඳුරු
නෝනාවරුනි, මුත්‍රාකර බලන්න නිකමට ආ දාක බඳුළු

ලේ බොන්න ඇඟිලි කරු ලියාගෙන කුඩඳළු පොකුරු
කෝඩෙකින් පසු ඇවිත් වපුරන්න පැල්පතක වී අහුරු
නින්දගම් අපට හැම තිස්සෙම උලුක් කරගෙන මුගුරු
තේ පඳුරකට ඇයි වෙන්න බැරි වුනෙ පඳුරක් කදුරු

ජීවිතය අළු වෙයි ලැයින් කාමරයක දඟරයක් සේ මදුරු
ගෝනියක මියැදෙන්න ඉපදෙයි කළුකරේ ලැයිමක ලදළු
ඇවිලෙන්න ඕනමද ලැව් ගින්නක් පහව යන්නට අඳුරු
ඇත්තටම තේ කුඩු කියන්නෙ වියලාපු අපේ කළුළු